ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් මම ජීවත්වෙමි. නමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වන සේක." (ගලාති 2 : 20)

83 වන වෙළුම අංක 02 (974) 2024 මාර්තු / අප්‍රේල්

තමාගේම ජීවිතය සහ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය

(ඇන්ඩ්‍රෘ මරේ විසිනි.)

"එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථාකොට, යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාව නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා" (මතෙව් 16:24)

මනුෂ්‍ය පුත්‍රයා කවරෙක්ය කියා මනුෂ්‍යයෝ කියද්දැයි යේසුස් වහන්සේ පිලිප්පි කායිසාරියේ දී උන්වහන්සේගේ ගෝලයන්ගෙන් ඇසූ බව මතෙව් 16:13 වන පදයේ සඳහන් වේ. ඔවුන් පිළිතුරු ලබා දුන් පසු නුඹලා මා කවුරුය කියා කියනවාදැයි යේසුස් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. **"සීමොන් පේත්‍රුස් උත්තර දෙවින්, ඔබ ක්‍රිස්තුස් වහන්සේය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝයයි කීවේය."** (මතෙව් 16:16) යේසුස් වහන්සේ ඔහුට මෙසේ පිළිතුරු දුන් සේක. **"යේසුස් වහන්සේ උත්තර දෙවින්, සීමොන්-බාර්-යෝනා, නුඹ ආශීර්වාද ලද්දෙක්ය. මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේ විස මාංශය හා රුධිරය වේක නුඹට එළිදැක්වී නොකළේය. මම නුඹට කියමි, නුඹ පේත්‍රුස්ය, තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය. ස්වර්ගරාජ්‍යයේ යතුර නුඹට දෙන්නෙමි. නුඹ පොළොවෙහි දී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ග යෙහිදී මුදනු ලබන්නේ යැයි ඔහුට කී සේක.** (මතෙව් 16:17-19)

ඊළඟට, මතෙව් 16:21 වන පදයේ, යේසුස් වහන්සේ උන්වහන්සේගේ මරණය සිදුවන ආකාරය පිළිබඳව ගෝලයන්ට දන්වන්නට පටන්ගත් සේක. එමෙන්ම පේත්‍රුස් යේසුස් වහන්සේට තරවටු කරන්නට පටන් ගත්තේ කෙසේද කියා මතෙව් 16:22 වන පදයේ සිට සඳහන් වේ. **"එවිට පේත්‍රුස් උන්වහන්සේ කැඳවා තරවටු කරන්ට පටන් ගෙන, ස්වාමීනී එය ඔබ කෙරෙන් දුරැවේවා. ඔබට කිසි කලකත් එසේ සිද්ධ නොවන්නේ යයි කීවේය. නුමුත් උන්වහන්සේ හැරී පේත්‍රුස්ට කථාකොට , සාතන් මා පස්සට යව, නුඹ මට බාධාවක්ය. මක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා විස දෙවියන් වහන්සේගේ කාරණා කල්පනා කරන්නේ නැතැයි කී සේක. එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථාකොට, යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාව නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා."** (මතෙව් 16:22-24)

ප්‍රතිවිරුද්ධ මත දෙකක් අතර සම්මුතියකට පැමිණීම පිළිබඳව අපි නිතර අසන්නෙමු. නමුත් ප්‍රශ්නය නම් එහි මූල පවතින්නේ කෙහේද යන්නයි. බොහෝ කිතුණුවන් දෙවියන් වහන්සේගේ දරුකමේ මහිමය සහ වරප්‍රසාදය තුළ ජීවත්වීම ප්‍රකාශ කරනවා වෙනුවට ලෝකයේ වහල්භාවයේ තම ජීවිත නාස්ති කර ගැනීමට හේතුව කුමක්ද .. ? සමහර විට අපට තවත් ප්‍රශ්නයක් මතුවිය හැකිය. අපි යම් දෙයක් වැරදි බව දැක එයට එරෙහිව සටන් කරන විට අපට එය ජයගත නොහැකිවීමට හේතුව කුමක් විය හැකිද ? අපි සියවතාවක් යාච්ඤා කර දෙවියන් වහන්සේට භාරවී සිටින නමුත් තවමත් මෙහි ජීවත්වන්නේ මිශ්‍ර, බෙදුණු, උද්‌යෝගිමත් නොවූ ජීවිතයක්වීමට හේතුව කුමක්ද ?

එම ප්‍රශ්න දෙකටම ඇත්තේ එක පිළිතුරකි. මුළු කරදරයටම මුල තමාම වේ. එම නිසා කවුරුහරි මගෙන් ඇසුවොත් විරුද්ධතාවයන් සමඟ මම සම්මුතියකට (එකඟතාවයකට) පැමිණීමේ ජීවිතයෙන් මිදෙන්නේ කෙසේද කියා, මගේ පිළිතුර වන්නේ , ඔබ මෙය කළ යුතුයි නැතිනම් වෙනත් දෙයක් කළ යුතුයි යන්න නොවේ. පිළිතුර වන්නේ තමාගේම පුද්ගලිකත්වයේ ජීවිතය වෙනුවට ඉහළින් පැමිණෙන නව ජීවිතයක් වන ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය ලබාගත යුතුය යනුයි. එවිට පමණක් ජයග්‍රාහකයෙක් විය හැකිය. අපි සැම විටම පිටත සිට ඇතුළට ගමන් කරන්නෙමු. අපි මෙහිදී එය ඉටුකරමු. අපි මෙම බයිබල් පදයේ "තමාම" යන එක් වචනය සලකා බලමු. යේසුස් වහන්සේ පේත්‍රුස්ට මෙසේ පැවසූ සේක. **"යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාව නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා"** (මතෙව් 16 :24)

එය ගෝලයන්ගේ ලක්ෂණයකි. කිතුණු ජීවිතයේ රහස නම් තමාව ප්‍රතික්ෂේප කිරීමයි. එවිට සියල්ල නිවැරදි වනු ඇත. පේත්‍රුස් ඇදහිලිවන්තයකු වූ අතර ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් උගන්වනු ලැබුවා වූ ඇදහිලිවන්තයෙකි. ඔහු ක්‍රිස්තුස් වහන්සේව සතුටුවන පුදුම සහගත පිළිතුරක් දී ඇත. **"ඔබ ක්‍රිස්තුස් වහන්සේය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය."** එය අපූර්ව වූ දෙයක් නොවෙයි කියා සිතන්න එපා. අපි ක්‍රිස්තියානි ධර්මයට අදාළ කාරණා ඉගෙන ගන්න නමුත් පේත්‍රුස් එසේ ඉගෙනගන්නේ නැත. පියාණන් වහන්සේගේ, ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් පේත්‍රුස්ට උගන්වනු ලබන බව යේසුස් වහන්සේ දුටු සේක. එබැවින් උන්වහන්සේ මෙසේ පැවසූ සේක. **"සීමොන් -බාර්-යෝනා, නුඹ ආශීර්වාද ලද්දෙක්ය. .... "**

නමුත් පේත්‍රුස් තුළ ලෞකික මනුෂ්‍යයා කොයිතරම් ශක්තිමත්ව සිටියාද කියා සැලකිල්ලට ගන්න. ක්‍රිස්තුස් වහන්සේ කුරුසිය ගැන කතා කරන නමුත් පේත්‍රුස් මහිමය ගැන සිතන්නේය. ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාය. .... ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය සහ උන්වහන්සේගේ මරණය පිළිබඳව පේත්‍රුස්ගේ මනසේ නොවීය. ඔහු එඩිතර ආත්ම විශ්වාසයකින් යුතුව පැවසුවේ නැත. ස්වාමීනී ....., කවදාවත් ඔබවහන්සේ කුරුසපත්වී මැරෙන්නේ නැත කියාය. යේසුස් වහන්සේ හැරී පේත්‍රුස්ට කථාකොට....., **"සාතන් මා පස්සට යව, නුඹ මට බාධාවක්ය. මක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා විස දෙවියන් වහන්සේගේ කාරණා කල්පනා කරන්නේ නැතැයි කී සේක."** (මතෙව් 16:23) වෙනත් වචන වලින් කියනවා නම් පේත්‍රුස් කථා කළේ ලෞකික මනුෂ්‍යයෙකු ලෙස මිස දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ඔහුට උගන්වන ලෙස නොවේ. එවිට යේසුස් වහන්සේ කියා සිටි දේ මතක තබාගන්න. ඇත්තටම මරණයට පත්විය යුත්තේ මම පමණක් නොව නමුත් ඔබත් මරණයට පත්විය යුතුය. යම් කෙනෙක් මාගේ ගෝලයෙකුවීමට කැමති නම්, ඔහු තමාවම ප්‍රතික්ෂේප කර, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ආ යුතු යැයි කී සේක. අපි "තමාම" යන ඒක වචනය මත රැඳී සිටිමු. අපේ අසාර්ථකත්වයේ මුල කුමක්දැයි අපි සැබවින්ම දන්නා අතර ගැලවීම සඳහා අපි ක්‍රිස්තුස් වහන්සේ වෙතට යාමට සූදානම් වන්නේ "තමාම" යනු කුමක්දැයි දැන ගැනීමට අපි ඉගෙන ගන්නා විට පමණි.

තමාගේම ජීවිතයේ ස්වභාවය

මුලින්ම අපි තමාගේම ජීවිතයේ ස්වභාවය සෝදිසි කර බලමු. එහිදී අපි අසන්නාවූ සමහර ප්‍රශ්න සටහන් කර ගනිමු. අපි එයින් මිදෙන්නේ කෙසේද....? පුද්ගලිකත්වය යනු දෙවියන් වහන්සේ මනුෂ්‍යයාව නිර්මාණය කර ලබා දී ඇති බලයයි. නිර්මාණය කරන ලද මනුෂ්‍යයාගේ කේන්ද්‍රය පුද්ගලිකත්වයයි. (තම කැමැත්තයි.) දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට හෝ දේවදූතයන්ට පුද්ගලිකත්වයක් (තම කැමැත්තක්) ලබා දුන්නේ ඇයි ... ? එහි පරමාර්ථ වූයේ අප එය හිස් භාජනයක් ලෙස දෙවියන් වහන්සේ වෙතට ගෙන ඒම සහ උන්වන්සේ ඊට ඇතුල්වීමයි. මගේ ජීවිතය උන්වහන්සේ වෙතට ගෙන ඒම සඳහා දෙවියන් වහන්සේ මට තම කැමැත්ත ලබා දී තිබෙන සේක. දවස් පතා උන්වහන්සේට එය භාර දෙමින්, දෙවියන් වහන්ස..., ඔබ වහන්සේ ඒ තුළ ක්‍රියාකරන්න මම එය ඔබට පූජා කරන්නෙමි කියා පවසන්න.

දෙවියන් වහන්සේට අවශ්‍ය වූයේ උන්වහන්සේගේ අලංකාරය, ප්‍රඥාව, බලය සහ දිව්‍යමය පූර්ණත්වය වැගිරවිය හැකි භාජනයකි. උන්වහන්සේ ඉර, සඳ, තරු, ගස්, මල් සහ තණකොළ මැවුවේ උන්වහන්සේගේ ප්‍රඥාවේ පොහොසත්ම, අලංකාරය සහ යහපත්කම පෙන්වීමටය. නමුත් ඒවා කරන්නේ කුමක්දැයි ඒ කිසිවක් දැන සිටියේනැත.

දෙවියන් වහන්සේ දේව දූතයන්ව මැවුවේ තම කැමැත්තෙන් ඔවුන් උන්වහන්සේ වෙතට පැමිණ තමන්වහන්සේගෙන් පුරවන ලද භාජන වන පිණිස ස්වේච්ඡාවෙන් යටත්වේදැයි බලන පිණිසය. නමුත් ඔවුන් සියල්ලෝම එසේ කළේ නැත. දේවදූතයන් විශාල කණ්ඩායමක ප්‍රධානියා (ලුසිෆර්) තමා දෙසම බැලීමට පටන් ගත්තේය. දෙවියන් වහන්සේ තමන්ට දී ඇති පුදුමාකාර බලයන් ගැන සිතා තමා ගැනම සතුටුවීමට පටන් ගත්තේය. මම වැනි ජීවියෙක් සෑම විටම දෙවියන් වහන්සේ මත රදා සිටිය යුතු දැයි සිතන්නට පටන් ගත්තේය. ඔහු තමාවම උසස් කර ගත්තේය. එය උඩඟුකමින් දෙවියන් වහන්සේගෙන් වෙන්වීම ප්‍රකාශ විය. ඒ මොහොතේම ඔහු ස්වර්ගයේ දේවදූතයෙකු වෙනුවට නිරයේ යක්ෂයෙකු බවට පත්විය. ස්වකැමැත්තෙන් දෙවියන් වහන්සේ වෙතට හැරී උන්වහන්සේව අප තුළ ප්‍රකාශවීමට ඉඩ හරිමින් මැවුම්කරුවාණන්ගේ මහිමය

2 පිටුවට

1 පිටුවෙන්

තමාගේම ජීවිතය සහ ක්‍රිස්තුස්...

අත්දකිමු. දෙවියන් වහන්සේගෙන් ඈත්වීම යනු නිරයේ අඳුර සහ ගින්නයි. ඒ අවස්ථාවේ දී සිදු වූ භයංකාර සිදුවීම අපි සියල්ලන්ම දනිමු. දෙවියන් වහන්සේ මනුෂ්‍යයාව මැවූ අතර සාතන් සර්පයෙකුගේ ස්වරූපයෙන් පැමිණ එම බව පරීක්ෂාවට ලක් කරමින් දෙවියන් වහන්සේ මෙන්වීමට සිතුවිල්ලක් ඇති කළේ නිදහස් කැමැත්ත ඇතිව යහපත සහ නපුර දැන ගැනීමේ අදහසිනි. සාතන් ඒව සමඟ කථාකරන අතරතුර සාතන්ගේ විෂ සහිත වචන සහ නිරයේ උඩඟුකම ඇය වෙතට යොමු කරනු ලැබීය. ඔහුගේ නපුරු ආත්මය, නිරයේ විෂ මනුෂ්‍යයා තුළට ඇතුල් විය. අපේ පළමු දෙමව්පියන් ගෙන් අපට උරුම වූයේ මෙම ශාපලත් ආත්මයයි.

මේ ලෝකයට පාපය, අන්ධකාරය, කාලකණ්ණිකම, දුක්ඛිත බව, නාස්තිය සහ විනාශය ගෙන ආවේ එම ආත්මයයි. නිරයේ ගණන් කළ නොහැකි යුගයන් පුරා සදාකාලිකවම පවතිනු ඇත්තේ තමාව පාලනය කරගත නොහැකි ආත්මවල ශාපය සහ මනුෂ්‍යයාව දෙවියන් වහන්සේගෙන් වෙන්කර ඉවතට ගෙනයාමේ ස්වභාවයයි. ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් කරන්නේ කමක්දැයි සම්පූර්ණයෙන් තේරුම් ගැනීමට සහ සම්පූර්ණ ගැලවීමේ කොටස්කරුවන්වීමට නම් තමාව ප්‍රතික්ෂේප නොකිරීමේ මෙම ශාපලත් ආත්මය අත්හැරිය යුතු බව තේරුම්ගෙන එය අත්හැරිය යුතුය.

මමත්වයේ ක්‍රියා

දැන් මමත්වයේ කාර්යයන් මොනවාද ....? මට බොහෝ දේ සඳහන් කළ හැකි නමුත් අපි දිගටම පවතින සරලම වචන ගනිමු. තම කැමැත්ත, ආත්ම විශ්වාසය, ආත්ම අභිමානය සහ තමාවම සතුටු කර ගැනීම මනුෂ්‍යයාගේ මහත් වූ පාපයයි. බොහෝ දෙනා විනාශ වෙන ලෝකය සමඟ එකඟතාවයන් ඇතිකර ගැනීමට හේතුව එයයි. මනුෂ්‍යයන්ට තමන්වම සතුටුකර නොගත යුතු සහ තමන්ගේම කැමැත්ත නොකළ යුතු ඇයි කියා තේරුම් ගැනීමට නොහැකිව තිබෙන්නේ ඇයි ... ? කිතුණුවෙකු යනු කිසි විටෙක තම කැමත්ත නොසොයන නමුත් සැම විටම දෙවියන් වහන්සේගේ කැමැත්ත සොයක්‍රිස්තුස් වහන්සේගේ ආත්මය තුළම ජීවත්වන මනුෂ්‍යයෙක් යන අදහස බොහෝ කිතුණුවන් කිසි විටෙක ග්‍රහණය කරගෙන නැත. **"මෙන්න ඛබගේ කැමැත්ත කිරීන්ට වම ඇවිත් සිටිමියි උන්වහන්සේ කී සේක."** (හෙබ්‍රෙව් 10:9) කිතුණුවන් දහස් ගණන් ක්‍රමවලින් තමන්වම සතුටු කරගන්නා අතරම සතුටින් සිටීමට, යහපත්ව සහ ප්‍රයෝජනවත්ව සිටින බව පෙන්වීමට උත්සාහ දරති. තම කැමැත්ත මුල් ඔවුන්ගේ ආශිර්වාදය කොල්ලකනු ලබන බව ඔවුන් නොදනිති. ක්‍රිස්තුස් වහන්සේ ප්‍රේතැස්ට පැවසුවේ ..., තමාව ප්‍රතික්ෂේප කරන්න කියා. නමුත් ප්‍රේතැස්ගේ ක්‍රියාවෙන් ප්‍රකාශ වූයේ මම මාවම නොව, මාගේ ස්වාමීන් වහන්සේව ප්‍රතික්ෂේප කරමි කියායය.

ඔහු එය වචන වලින් කිසි විටෙකත් නොකී නමුත් ක්‍රිස්තුස් වහන්සේ පැවසුවේ නුඹ අන්තිම රාත්‍රියේදී මා ප්‍රතික්ෂේප කරනවා ඇත කියායය. ඔහු එය එලෙසින්ම කළේය. එයට හේතුව කුමක්ද ...? තමාවම සතුටුකර ගැනීමයි. (තමාවම ආරක්ෂා කර ගැනීමට උත්සාහ දැරීමයි) නමුත් යේසුස් වහන්සේට අයිති කෙනෙකැයි කාන්තාවක් චෝදනා කළ විට ප්‍රේතැස් බය විය. ප්‍රේතැස් තුන් වරක්ම යේසුස් වහන්සේව නාදුණන බව කීවේය. උන්වහන්සේ සමඟ කිසිදු සම්බන්ධතාවයක් නැත කියා උන්වහන්සේව ප්‍රතික්ෂේප කළේය.

ටිකක් සිතන්න. ප්‍රේතැස් ඒ ගැන දැඩි වේදනාවකින් කඳුළු සැලීම පුදුමයක් නොවේ. එම අවලක්ෂණ, ශාපලත්, තම කැමැත්ත තෝරාගෙන, ආශිර්වාදලත්, අලංකාර වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාව ප්‍රතික්ෂේප කළේය. මම මාව ප්‍රතික්ෂේප කරනවා වෙනුවට ක්‍රිස්තුස් වහන්සේව ප්‍රතික්ෂේප කිරීම තෝරා ගත්තා කියා දැඩි වේදනාවෙන් හඬා වැටීම පුදුමයක් නොවේ.

කිතුණුවෙනි, යේසුස් වහන්සේගේ වචනවල ආලෝකයෙන් ඔබගේ ජීවිතය දෙස බලන්න. ඔබ ඔබගේ ජීවිතය තුළ තම කැමැත්ත, තමාවම සතුටු කරගැනීම දකිනවාද ? මෙය මතක තබාගන්න. ඔබ ඔබව සතුටුකරගන්නා වූ සෑම මොහොතකම ඔබ යේසුස් වහන්සේව ප්‍රතික්ෂේප කරනු ලබන්නේය. එය දෙකෙන් එකකි. ඔබ උන්වහන්සේව පමණක් සතුටු කළ යුතුය. නැතිනම් ඔබ ඔබවම සතුටු කරගෙන උන්වහන්සේව ප්‍රතික්ෂේප කළ යුතුය.

ඊළඟට ආත්ම විශ්වාසය නිසා, ආත්ම අභිමානය, තම උත්සහය, තමා මතම යැපීම අනුග මනය කරනු ලබයි. යේසුස් වහන්සේව ප්‍රතික්ෂේප කිරීමට ප්‍රේතැස්ව පෙළඹවූයේ කුමක්ද ? ක්‍රිස්තුස් වහන්සේ ප්‍රේතැස්ට අනතුරු ඇඟවූ සේක. ප්‍රේතැස් ඒ අනතුරු ඇඟවීම භාර නොගත්තේ ඇයි .. ? තමා කෙරෙහිම තිබුණා වූ ආත්ම විශ්වාසය නිසාය. ස්වාමීනී ...., මම ඔබට ආදරෙයි. අවුරුදු තුනක් මම ඔබ පසු පසු පැමිණියෙමි. මම ඔබ උදෙසා සිරගෙ දරටත්, මරණයට මුහුණදීමට වුවත් සූදානම්ව සිටිමි. එය තමා කෙරෙහිම විශ්වාසය තැබීමයි.

මනුෂ්‍යයන් බොහෝ විට මගෙන් අසන්නේ තමන් ඉතා උනන්දුවෙන් දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව ජීවත්වීමට යාච්ඤා කරන නමුත් තමන් අසාර්ථක වන්නේ ඇයි කියායය. සාමාන්‍යයෙන් මගේ පිළිතුර වන්නේ, ඔබ ඔබවම විශ්වාස කරන නිසාය යන්නයි. මම එසේ නොකරමි. මම යහපත් නොවන බව මම දනිමි. දෙවියන් වහන්සේ මාව ජීවත් කරන බව මම දනිමි. මම යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරමි කියා, ඔවුන් සාමාන්‍යයෙන් පිළිතුරු දෙන්නේ නැත.

නුමුත් මාගේ සහෝදරය, ඔබ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කරනවා නම් ඔබ වැටෙන්නේ නැහැ. ඔබ විශ්වාස කරන්නේ ඔබවමයි යනු මගේ පිළිතුරයි. කිතුණු ජීවිතයේ සෑම අසාර්ථකත්වයකටම හේතුව මෙය මිස වෙන කිසිවක් නොවන බව අපි විශ්වාස කරන්නෙමු. මනුෂ්‍යයන් යේසුස් වහන්සේව විශ්වාස කරනවා වෙනුවට තමාවම විශ්වාස කිරීමේ ශාපලත් තත්ත්වයට හසුව සිටින්නෝය. දෙවියන් වහන්සේගේ සර්වබලධාරී ශක්තිය වෙනුවට තමාගේම ශක්තිය විශ්වාස කරන්නේය. තමාවම ප්‍රතික්ෂේප කළ යුතුය කියා ක්‍රිස්තුස් වහන්සේ පවසන්නේ එම නිසාය. තමා ගැන උදාරම් බව තමකමේ තවත් ක්‍රියාවකි. කිතුණුවා තුළ කොපමණ උඩඟුකමක් සහ ඊර්ෂ්‍යාවක් තිබෙනවා ද ? මනුෂ්‍යයන් අප ගැන කියන දේ හෝ අප ගැන සිතන දේ පිළිබඳව කොපමණ සංවේදී බවක් තිබෙනවාද? මම දෙවියන් වහන්සේව සතුටු කරනවාද යන සිතුවිල්ල ඇතිව ජීවත් වෙනවා වෙනුවට මනුෂ්‍ය ප්‍රශංසාව සහ මනුෂ්‍යයන්ව සතුටු කිරීමට කොයිතරම් ආශාවක් තිබෙනවාද ..? ක්‍රිස්තුස් වහන්සේ මෙසේ ඇසූ සේක. **"එකම දෙවියන් වහන්සේ කෙරෙන් පැවිණෙන ගෞරවය නොසොයා එකිනෙකාගෙන් ගෞරවය ලබන්නා වූ නුඹලාට විශ්වාසකිරීන්ට පුළුවන් කොහොමද ..?"** (යොහාන් 5:44) වෙනත් කෙනෙකුගෙන් ප්‍රශංසාව ලැබීම ඇදහිල්ලේ ජීවිතය තුළ කිසිසේත්ම කළ නොහැකි දෙයකි. මෙම ආත්මයේ ස්වභාවය ආරම්භ වූයේ නිරයෙනි. එය අපව දෙවියන් වහන්සේගෙන් වෙන් කරන අතර යේසුස් වහන්සේ වෙතින් අපව නොමඟ යවන ශාපලත් රැවටිලිකාරකමකි.

ආකර්ෂණීය (ගාම්භීර) හුවමාරුව

දැන් අපි පැමිණෙන්නේ තුන්වන කාරණයටයි. එයින් මිදීමට අප කළ යුත්තේ කුමක්ද ? අපි අවධානය යොමු කරන බයිබල් පාඨයෙන් යේසුස් වහන්සේ අපට පිළිතුරු ලබාදෙන සේක. **"යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඩහු තමාම නොසලකා තමාගේ කුරුසිය රිගෙන මා අනුව එවා"** එය හොඳින් සටහන් කරගන්න. මම මාවම ප්‍රතික්ෂේප කර යේසුස් වහන්සේව මගේ ජීවිතය කරගත යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය හෝ තමාගේ ජීවිතය යන දෙකෙන් එකක් තෝරාගත යුතුය. ඔබගේ පැවැත්මේ නීතිය, ඔබගේ හැසිරීමේ රීතිය මා බවට පත්කර ගන්න. ඔබේ මුළු හදවත මට දෙන්න. මාව අනුගමනය කරන්න. මම ඔබ ගැන බලාගන්නම් කියා අපගේ ස්වාමීන් වහන්සේ පවසන සේක.

මිත්‍රවරුණි, අප ඉදිරියේ තිබෙන ආකර්ෂණීය හුවමාරුවෙන් පැමිණෙන දුෂ්ඨකමේ සහ උඩඟුකමේ, තමාව ප්‍රතික්ෂේප කිරීමේ ආත්මයේ අනතුරු දැක දෙවියන් වහන්සේගේ පුත්‍රයා ඉදිරියේ ඔබගේ මමත්වය හෙළා දමා, මම මාගේ ජීවිතය ප්‍රතික්ෂේප කර ඔබවහන්සේගේ ජීවිතය මගේ කර ගනිමි කියා පවසන්න. කිතුණුවන් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය ඔවුන් තුළට ඇතුල්වීම සඳහා ප්‍රතිඵලයක් නොමැතිව දිගටම යාච්ඤා කිරීමට හේතුව තමාවම ප්‍රතික්ෂේප නොකිරීමයි. මම මේ ආත්මයෙන් (තමාවම ප්‍රතික්ෂේප නොකිරීමේ ආත්මයෙන්) මිදේන්නේ කෙසේදැයි ඔබ ඇසිය හැකිය. බලවන්තයා තමාට වඩා බලවන්තයෙකු පැමිණ ඔහුව නෙරපා දමන තුරු එහිම රැඳී සිටිනවා යන උපමාව ඔබ දැන සිටින්නේය අශුද්ධාත්මයක් දුරු වූ විට එම ස්ථානය පාළුව අතුගා පිරිසිදුකර පිළිවෙලට තබා තිබෙන බව දකිද්දී තමාට වඩා නරක වෙනත් ආත්ම හතක් සමඟ ආපසු පැමිණියේය. (ලුක් 11:21-26) තමාවම ප්‍රතික්ෂේප කිරීමට හැකිවන්නේ ක්‍රිස්තුස් වහන්සේටම පමණි. තමාව ප්‍රතික්ෂේප නොකිරීමේ ආත්මයට උවමනා වී තිබෙන්නේ අවසානය දක්වාම අප සමඟ රැඳී සිටීමටය.

අපෝස්තුළු පාවුල් කියන දේ මතක තබාග න්න. තමාවම උසස් කර නොගන්නා ලෙස මාංශයේ කටුව ඔහුව පහත් කිරීමට එවන ලද බව ස්වර්ගීය දර්ශනයක් ඔහු දැක තිබේ. (2 කොරින්ති 12: 2-9) තමාවම උසස් කිරීමේ ප්‍රවණතාවයක් ඇත. එය ස්වභාවික වූ අතර එය ඔහුගෙන් ජයගෙන ඇත. නමුත් ක්‍රිස්තුස් වහන්සේ තම ආදරණීය සේවකයා කෙරෙහි විශ්වාසවන්තව සිට ඔහුව එයින් ගලවා ගත්සේක. යේසුස් ක්‍රිස්තුස් වහන්සේට එම හැකියාව තිබෙන සේක. උන්වහන්සේගේ දිව්‍යමය අනුග්‍රහය කරුණුකොටගෙන තමාගේම ආත්ම ශක්තිය කිසි විටෙක තමන් විසින්ම තහවුරු කර ගැනීම හෝ අනිත් පැත්තට හැරවීම වැලැක්වීමට යේසුස් වහන්සේගේ ආත්මයේ ජීවිතය කැමැත්තෙන් සිටියි. උන්වහන්සේව අනුගමනය කිරීමටත් අපගේ හදවත සහ ජීවිතය උන්වහන්සේ මත පමණක් තබා ගැනීමටත්, අපට ඉගැන්වීමටත් උන්වහන්සේ කැමැත්තෙන් සිටින සේක. උන්වහන්සේ සෑම විටම අපගේ ආලෝකය විය යුතුය.

ගලාති 2:20 වෙතට පැමිණි විට පාවුල් පවසන්නේ කුමක්ද ? **"වම ක්‍රිස්තුස් වහන්සේ සවඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් වම ජීවත් වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මංශයෙහි ජීවත්වන ජීවිතය වට ප්‍රේම කළා වූ, මා උදෙසා තමන්ව පාවාදුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි අදහිල්ලෙන් ජීවත්වෙමි. "** (ගලාති 2:20) සත්‍යතාවයන් දෙකක් එකට ගමන් කරයි. එනම් ප්‍රථමයෙන්, **"තවත් වම නොව.... "** දෙවනුව , **"නමුත් ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. "**

නැවතත් ප්‍රේතැස් දෙස බලන්න. ක්‍රිස්තුස් වහන්සේ ඔහුට පැවසුවේ, නුඹවම ප්‍රතික්ෂේප කර මාව අනුගමනය කරන්න කියා වන සේක. ඔහුට අනුගමනය කළ යුතුව තිබුණේ කොතැනද .. ? ඔහු අසමත් වුවද යේසුස් වහන්සේ ඔහුව මෙහෙය වූ සේක. උන්වහන්සේ ඔහුව ගෙන ගියේ කොහේටද .. ? යේසුස් වහන්සේ ඔවුන් ගෙත්සෙමනේ උයනට ගෙන ගිය සේක. ප්‍රේතැස් එහිදී අසාර්ථක වූයේය. අවදිව බලා සිටිමින් යාච්ඤා කළ යුතු වූ විටදී ඔහු නිදාගත්තේය. යේසුස් වහන්සේ කල්වාරිය දෙසට එනම්, ප්‍රේතැස් උන්වහන්සේව ප්‍රතික්ෂේප කළ ස්ථානයට ගෙන ගිය සේක. එය ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙයවීමයි. දෙවියන් වහන්සේට ප්‍රශසංසා කරන්න. ශුද්ධාත්මයාණන් වහන්සේ ඒ වන විට ඔවුන් මත නතරවීමට පැමිණ තිබුණේ නැත. ප්‍රේතැස්

3 පිටුවට

2 පිටුවෙන්

තමාගේම ජීවිතය සහ ක්‍රිස්තුස්...

ඒ වන විටත් ලෞකික මනුෂ්‍යයෙකි. ඔහුගේ ආත්මය කැමැත්තෙන් තිබූ නමුත් ඔහුගේ පව්කාර ස්වභාවය පරාජය කිරීමට ඔහුට නොහැකි විය.

ක්‍රිස්තුස් වහන්සේ කළේ කුමක්ද .. ? ප්‍රේත්‍රැස් සම්පූර්ණයේම මමත්වයේ අවමානයෙන් බිඳී ශෝකය තුළ ගැඹුරින් නිහතමානි වන තෙක් උන්වහන්සේ ඔහුව ඉදිරියට ගෙන ගිය සේක. යේසුස් වහන්සේ සොහොන්ගේ පසුකර නැවත නැගිටීම හරහා පෙන්තකොස්ත දවස දක්වා ප්‍රේත්‍රැස්ව ගෙන ගිය සේක. පෙන්තකොස්ත දවසේදී ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීමත් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය ජීවිතය පැමිණිය සේක. එවිට ක්‍රිස්තුස් වහන්සේ ඔහු තුළ ජීවත් වූ සේක.

මෙම මමත්වයේ ආත්මය තුලින් මිදීමට ඇත්තේ එක මාර්ගයක් පමණි. අප ක්‍රිස්තුස් වහන්සේව අනුග මනය කළ යුතුය. අපගේ හදවත් උන්වහන්සේ කෙරෙහි තැබිය යුතුය. උන්වහන්සේගේ ඉගැන්වීම්වලට ඇහුම්කන්දිය යුතුය. උන්වහන්සේ අපට සියල්ල වන පිණිස දවස්පතා අපවම අත්හැරිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ බලයෙන් තමාවම ප්‍රතික්ෂේප කිරීම නොවතින ආශිර්වාදලත් යතාර්ථයක් වනු ඇත. ප්‍රතික්ෂේප කිරීමට මට කිසිවක් නැතැයි පැවසිය හැකි මට්ටමකට ළඟාවනු අතැයි මම කිසිවිටෙක පැයකටවත් බලාපොරොත්තු නොවෙමි. මට කිසිදාක එක මෙහොතකටවත් මට මාවම ප්‍රතික්ෂේප කරන්නට අවශ්‍ය නැහැ කියා කිව නොහැකිය. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය සමඟ ඇති මෙම සහයෝගීතාවය දෙවියන් වහන්සේගේ කරුණාවෙන් සෑම පැයකම, සෑම මොහොතකම නොනවතින තමාවම ප්‍රතික්ෂේප කිරීමක් වනු ඇත. මේ පව්කාර ජීවිතයේ බලයෙන් සම්පූර්ණ මිදීමක් ඇති තැනක් නොමැත. අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණගසනු ලබන්නෙමු. උන්වහන්සේගේ මරණයට බොහෝ ඉස්සර වූ අය ලෙස උන්වහන්සේ සමඟ ජීවත් විය යුතුය. ඒ ගැන සිතන්න. ක්‍රිස්තුස් වහන්සේට පාපිෂ්ඨ ජීවිතයක් තිබුණේ නැත. නමුත් උන්වහන්සේ තම ජීවිතය මරණයට පාවා දුන සේක. ගෙත්සෙමනේ උයනේදී උන්වහන්සේ මෙසේ පැවසූ සේක. "පියාණෙනි..., මාගේ කැමැත්ත නොව", එම පව් නොකළා වූ ජීවිතය මරණයට පවා දුන්නේ මළමුවන්ගෙන් නැගිටීම තුළ දෙවියන් වහන්සේගේ මහිමයට පත්වන පිණිසය. යේසුස් වහන්සේ ගිය ක්‍රමය හැර වෙන ක්‍රමයකින් අපට ස්වර්ගයට යාම අපේක්ෂා කළ හැකිද ..? ප්‍රවේසම් වෙන්න. කිස්තුස් වහන්සේ මරණයට හා සොහොන් ගෙදරට බැස ගිය බව මතක තබාගන්න. මමත්වයට මරණයට පත්වීමේදී යේසුස් වහන්සේව උපරිමයෙන් අනුග මනය කරමින් ගැලවීම සහ ජීවනයට පැමිණෙනු ඇත.

ස්වාමීන් වහන්සේ ඉදිරියේ ඔබගේ ජීවිතය යටහත් කරන්න.

දැන් අපගේ ස්වාමීන් වහන්සේගේ මෙම පාඩමෙන් අපට ඇති ප්‍රයෝජනය කුමක්ද .. ?

පළමුවන පාඩම වනුයේ දෙවියන් වහන්සේ ඉදිරියේ නිහතමානීවීමට අපි කාලය ගත කල යුතු බවයි. අප තුළ ඇති මෙම ආත්මයේ ස්වභාවය කෙබඳු දැයි සොද්සි කර බලන්න. සෑම පාපයක්ම සෑම අඩුපාඩුවක්ම, සියළුම අසාර්ථකත්වයන් සහ දෙවියන් වහන්සේට අගෞරවයක් වූ සියල්ල මමත්වයේ ගිණුමට බැර කරන්න. ඊළඟට ස්වාමීන් වහන්ස ...., මම මෙහි කියා කියන්න. එවිට ආශිර්වාදලත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපගේ ජීවිතය පාලනය කිරීමට භාර දෙන්නෙමු. ඇදහිල්ලෙන් උන්වහන්සේගේ ජීවිතය අපේ ජීවිතය වනු ඇත. මමත්වයෙන් මිදෙන එක ලෙහෙසි දෙයක් කියා නොසිතන්න. කැපකිරීමේ රැස්වීමකදී යම් තීරණයක් ගැනීම, යාච්ඤාවක් කිරීම සහ යටහත්වීමේ ක්‍රියාවක් කිරීම පහසුය. නමුත් ක්‍රිස්තුස් වහන්සේ කල්වාරි කුරුසියේදී මරණයට මුහුණ දෙමින්, පව් නොකල උන්වහන්සේ තමන් වහන්සේගේ ජීවිතය දෙවියන් වහන්සේට දීම, අප සහ දෙවියන් වහන්සේ අතරේ සම්බන්ධතාවයට සහ තමකමට අපගේ මරණය සඳහා ඉතා වැදගත් වූයේය. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයේ බලය සෑම දිනකම අප තුළ ක්‍රියාත්මක විය යුතුය.

තම කැමැත්ත ඇති ප්‍රේත්‍රැස් සහ යේසුස් වහන්සේ තම කැමැත්ත දෙවියන් වහන්සේට භාරදීම අතර කොයිතරම් වෙනසක් තිබේදැයි සිතන්න. ප්‍රේත්‍රැස්ගේ මමත්වය තුළ උසස්වීම සහ දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා ඉදිරියේ නිහතමානීව හා යටහත් පහත් සිතින් යුත් දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණන්ගේ ගැඹුරු යටහත් පහත්කම අතර මොනතරම් වෙනසක් තිබුණාද..? ප්‍රේත්‍රැස්ගේ එම ආත්ම විශ්වාසය (තමන් ගැනම තිබූ විශ්වාසය) සහ මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි යේසුස් වහන්සේ කී විට පියාණන් වහන්සේ මත ගැඹුරින් යැපීම අතර කොයිතරම් වෙනසක් තිබේද .. ? ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය ගත කිරීමට අපව කැදවනු ලබන අතර ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිතය ගතකිරීමට අප තුළට පැමිණෙන සේක. නමුත් ප්‍රථමයෙන් අප කළ යුතු දේ නම්, අප අපවම ප්‍රතික්ෂේප කිරීමට ඉගෙන ගත යුතුයි. ප්‍රේත්‍රැස් යේසුස් වහන්සේව ප්‍රතික්ෂේප කරමින් මට උන්වහන්සේ සමඟ සම්බන්ධයක් නැහැ කියා පැවසුවාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින සියල්ලන් මට මගේ මමත්වයත් සමඟ කිසිදු සම්බන්ධතාවයක් නැතැයි පැවසිය යුතුය.

මෙම මමත්වයේ ආත්මය අපට කළ දේ සහ යේසුස් වහන්සේට අගෞරව කර ඇති ආකාරය ගැන සිතිමේදී අපි නිහතමානී වෙමු. අපි ඉතා උනන්දුවෙන් යාච්ඤා කරමු. ස්වාමීනී, ඔබගේ ආලෝකයෙන් මෙම ආත්මය සොයා ගැනීමට එය අපට එළිදරව් කරන ලෙස අපි ඔබවහන්සේගෙන් අයැද සිටින්නෙමු. එය අපට කර ඇති දේ සහ එයින් අපට ඇති බාධාව දැකීමට අපගේ දෑස් පැහැදුව මැනව. ඉන්පසුව අපගේ සියළුම ආගමික ක්‍රියාකාරකම්වලින් ඉවත්වන තුරු දැඩි ලෙස යාච්ඤා කරමු. මෙම එක් යාච්ඤාවකින් දෙවියන් වහන්සේට ළං වන තෙක් දෙවියන් වහන්සේ කෙරෙහි බලා සිටිමු. "ස්වාමී වූ දෙවියන් වහන්ස ... , මමත්වය අග්‍රදේවදූතයෙකුව යක්ෂයෙකු බවට පත්කර මගේ මුල් දෙමව්පියන්ව විනාශ කළේය. මමත්වය ඔවුන්ව පාරාදීසයෙන් පිටතට ගෙනාවේ අන්ධකාරයට සහ දුක්ඛිත තත්ත්වයට වන අතර මාගේ ජීවිතයේ විනාශය සහ සෑම අසාර්ථකත්වයකටම හේතුව මමයි. එය තේරුම් ගැනීමට මට උපකාර කළ මැනව. කුරුසිය කරට ගෙන යේසුස් වහන්සේ සමඟ මරණයට පත්වෙන්න. උන්වහන්සේව පමණක් අනුගමනය කරන්න. එවිට උන්වහන්සේ ඔබ තුළ ජීවත්වන සේක.

අප වෙනුවෙන් මරණයට පත්වී නැවත මළවුන්ගෙන් නැගිටුණා වූ තැනැත්තාණන්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙන්න.

(රිවි කාර්මයිකල් විසිනි.)

අපේ පව්කමාකර සදාකාල ජීවනයේ ත්‍යාගය ලබාදීම සඳහා අපගේ ප්‍රේමණීය ස්වාමීන් වහන්සේ සහ ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය පූජා කිරීමට කුරුසියට යාමට තිබූ කැමැත්ත ගැන අපගේ සම්පූර්ණ අගය පෙන්වීමට පටන් ගන්නේ කෙසේද ? අපගේ පාපයන් වෙනුවෙන් දුක්විඳීමෙන් සහ මිය යාමෙන් උන්වහන්සේ විඳ දරාගත් දේ පිළිබඳව එක් විස්තරයක් පමණක් සලකා බලන්න.

"උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් සුළුකොට එපා කරනු ලැබූ සේක. වේදනා ඇත්තා වූ, දුක දන්නා වූ මනුෂ්‍යයෙක්ය. මනුෂ්‍යයන් විසින් තමුන්ගේ මුහුණ සඟවාගන්න කෙනෙකු මෙන් උන්වහන්සේ සුළු කරනු ලැබූ සේක. අපිද උන්වහන්සේ නොසැලකුවෙමුව. සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ අපේ දුක්ය. දරාගත්තේ අපේ ශෝකය. එසේ වී නමුත් උන්වහන්සේ දඬුවමද දෙවියන් වහන්සේගෙන් පහර ද පීඩාවද ලැබූ කෙනෙකැයි අපි සිතමුව. නමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙන දෙන දඬුවම උන්වහන්සේ පිටට පැටලුණුනේය. උන්වහන්සේගේ පහර වලින් අපට සුවය ලැබී තිබේ. අපි සියල්ලෝම බැටළුවන් වෙන් වුලා වී එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව. ස්වාමීන් වහන්සේ ද අප සියල්ලන්ගේ අයුතුකම උන්වහන්සේ පිට තැබූ සේක. උන්වහන්සේට පීඩා කළ විට උන්වහන්සේ යටත් වී තමන්ගේ මුඛය නැළු සිටි සේක. මරන්ට ගෙන යන බැටළු පැටවෙකු වෙන්ද, බැටළු දෙනක් ලෝම කපන්නන් ඉදිරියෙහි නිශ්ශබ්දව සිටින්නාක් වෙන්ද, උන්වහන්සේ තමන් මුඛය නැළු සිටි සේක. උන්වහන්සේ බලාත්කාරකමෙන්ද විනිශ්චයෙන්ද පහකරනු ලැබූ සේක. ජීවත්ව සිටින්නන්ගේ දේශයෙන් උන්වහන්සේ සිඳ දමනු ලැබූ බව උන්වහන්සේගේ පරම්පරාවෙහි කවරෙක් කල්පනා කළේද ... ? උන්වහන්සේ තලනු ලැබුවේ සෙනඟගේ වරද නිසාය. ඔවුහු උන්වහන්සේගේ මිනීවල දුෂ්ඨයන් අතරෙහි තිබෙන්ට නියම කළෝය. නමුත් උන්වහන්සේගේ මරණයේදී එය වස්තුකාරයන් සමඟ විය. මක්නිසාද උන්වහන්සේ අධර්මිෂ්ඨකමක් කළේවත් උන්වහන්සේගේ මුඛයෙහි කිසි ප්‍රයෝගයක් තිබුණේවත් නැත. එහෙත් උන්වහන්සේ පොඩිකරන්ට ස්වාමීන් වහන්සේ කැමතිව දුකට පත්කළ සේක. ඔබ උන්වහන්සේගේ ප්‍රාණය පාප පූජාවක් කරන විට උන්වහන්සේ තමන්ගේ වංශය දැක තමන් දවස් වැඩිකරන සේක. ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ද උන්වහන්සේගේ අතෙහි සුවිල වන්නේය. උන්වහන්සේ තමන් ආත්ම වේදනාවේ වල දැක තෘප්තියට පැමිණෙන සේක. මාගේ ධර්මිෂ්ඨ සේවකයා ස්වකීය දැන ගැන්ම කරුණුකොට ගෙන බොහෝ දෙනෙකු ධර්මිෂ්ඨ කරනවා ඇත. ඔවුන්ගේ අයුතුකම් ද උන්වහන්සේම දරාගන්නවා ඇත. එබැවින් මම බොහෝ දෙනෙකු අතරෙහි උන්වහන්සේට කොටසක් බෙදා දෙන්නෙමි. බලවන්තයන් සමඟ ද උන්වහන්සේ කොල්ලය බෙදාගන්නවා ඇත. මෙසේ වන්නේ තමන් ප්‍රාණය, මරණයට වගුරුවා දී වරදකාරයන් සමඟ ගණන් ගනු ලැබ, උන්වහන්සේ බොහෝ දෙනෙකුගේ පාප උසුලාගත් නිසාය. වරදකාරයන් උදෙසා ද උන්වහන්සේ මැදහත්කම් කරන සේක." (යෙසායා 53:3-12)

කුරුසියේ දුක්විඳීම සහ නින්දාව අපේක්ෂා කළ විට උන්වහන්සේට එය කොයිතරම්

4 පිටුවට

3 පිටුවෙන්

අප වෙනුවෙන් මරණයට...

දුෂ්කර වූවාද යන්න, උන්වහන්සේ මරණයට පත්වීමට පෙර දින රාත්‍රියේ ගොත්සෙමනේද කළ යාච්ඤාව අපට අවබෝධයක් ලබාදෙයි. **“ගලක් ගසන දුර පමණ උන්වහන්සේ ඔවුන්ගෙන් වෙන්වී දණින් හිඳ යාච්ඤා කරමින් පියාණෙනි, ඔබ කැමති සේක් නම් මේ කුසලාන මාගෙන් පහ කළ මැනව එසේ වී නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි කී සේක. එකල ස්වර්ගයෙන් දේවදූතයෙක් උන්වහන්සේට පෙනී උන්වහන්සේ ශක්තිමත් කළේය. උන්වහන්සේ මහත් වේදනා වින්දසේක් වඩා ඕනෑකමින් යාච්ඤා කළ සේක. උන්වහන්සේගේ ඔදිය ද මහත් ලේ බින්දු මෙන් බිම වැටුණේය.”** (ලූක් 22:41-44)

යේසුස් වහන්සේ උන්වහන්සේගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට ලෝකයට පැමිණිය සේක. (හෙබ්‍රෙව් 10:5-10) කොයිතරම් විශාල මිලයක් ගෙවීමට සිදුවුවත් උන්වහන්සේ එම කැමැත්තට සම්පූර්ණයෙන්ම යටත් වූ සේක. **“මනුෂ්‍යයාකාරයෙන් සිටිය කලත් මරණය එසේය. කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක.”** (පිලිප්පි 2:8) **“උන්වහන්සේ වනාහී තමන් ඉදිරියෙහි තබා තිබුණු ප්‍රීතිය නිසා ලැජ්ජාව නොසලකා කුරුසිය දරාගෙන පසුව දෙවියන් වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තෙහි වැඩ හිඳගත් සේක.”** (හෙබ්‍රෙව් 12:2) දෙවියන් වහන්සේගේ පුත්‍රයාව සෑම අතින්ම පරිපූර්ණ හා ශුද්ධ වූ, පාපය උදෙසා පූජාවක් ලෙස කුරුසියේ ඇණ ගැසුවෝය. මීට වඩා විශාල කැප කිරීමක් කිසිවෙකුට කළ නොහැකිය. උන්වහන්සේගේ ලේ තුලින් අපට මිදීම සහ සමාව ලබා දී තිබේ. (කොලොස්සි 1:14)

නැවත නැගිට සදාකාලයටම ජීවමානව සිටින සේක

ඒ අතරම අපගේ ස්වාමීන් වහන්සේ සහ ගැලවුම්කරුවාණන් තවදුරටත් සොහොන් ගෙයි නොසිටින නමුත් දෙවියන් වහන්සේ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ සේක. මෙම යතාර්ථය පිළිබඳ අපගේ ප්‍රීතිය ප්‍රකාශ කරන්නේ කෙසේද .... ? **“ උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළ ඉෂ්ඨ කළා වූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස් වහන්සේව මළවුන්ගෙන් නැඟිටුවා සියළු අධිපතිකමටත්, බලයටත්, පරාක්‍රමයටත්, වේ ලෝකයෙහි පමණක් නොව පරාලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම් වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා ....”** (එපීස 1:20-21) යේසුස් වහන්සේම ප්‍රකාශ කරන පරිදි..., **“වම වැරැෂෙමි. නමුත් බලව වම දැන් සදාකාලේටම ජීවත්ව සිටිමි. මරණයේදී පාතාලයේ ද යතුරු වට ඇත්තේය. ”** (එළිදරව් 1:18) මැරී නැවත නැගිටුණා වූ යේසුස් වහන්සේගේ නැවත පැමිණීම ගැන අපට තිබෙන්නේ මොනතරම් ආශිර්වාදලත් බලාපොරොත්තුවක් ද ... ? **“එක්නිසාද ස්වාමීන් වහන්සේව මහත් ශබ්දයක් ද, උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතුව ස්වර්ගයෙන් බස්නා සේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ මළා වූ අය පළමුකොට නැඟිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමඟ ස්වාමීන් වහන්සේ සම්මුඛවන පිණිස වළාකුළුවලින් අහසට ඇදගනු ලබන්නෙමුව. වෙසේ අපි නිතරම ස්වාමීන් වහන්සේ සමඟ සිටින්නෙමුව.”** (1 තෙසලෝනික 4:16-17)

ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ජීවත්වීම

ඒ දවස සහ ඉන් ඔබ්බට බලා සිටීමට පමණක් නොව ක්‍රිස්තුස් වහන්සේගේ මරණය සහ අප තුළ ක්‍රියාත්මක වන ජීවන බලය තුලින් දෙවියන් වහන්සේගේ මහිමය තුළ පූර්ණ ලෙස ජීවත්වීමට අපට දැන් හැකිවේ. **“එබැවින් ක්‍රිස්තුස් වහන්සේ පියාණන් වහන්සේගේ මහිමය කරුණාකොගෙන මළවුන්ගෙන් නැඟිටුවනු ලැබුවාසේම අපිත් ජීවනයේ අළුත්කමින් හැසිරෙන පිණිස මරණය තුළට බෞතිස්මය කරුණාකොටගෙන උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවෙමුව.”** (රෝම 6:4) **“එලෙසම නුඹලාත් පාපයට මැරී සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතට ගනිල්ලා.”** (රෝම 6:11) ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය දැන ගැනීම කොපමණ ධෛර්යයක් ලබාදෙනවාද ..? එමෙන්ම ක්‍රිස්තුස් වහන්සේව මළවුන්ගෙන් නැගිටුවීමට පියාණන් වහන්සේ පාවිච්චි කළ බලවත් බලය අප තුළ ක්‍රියාත්මක කරන සේක. (එපීස 1:19-20)

කෙසේවෙතත් මේ සියල්ල ආරම්භ වන්නේ ක්‍රිස්තුස් වහන්සේ කළාක් මෙන් දෙවියන් වහන්සේගේ කැමැත්තට පූර්ණ ලෙස යටත්වීමෙනි. **“එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථාකොට, යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා. එක්නිසාද යමෙක් තමාගේ ජීවිතය ගලවාගන්ට කැමතිවේද ඒක ඔහුට නැති වන්නේය. මා නිසා තමාගේ ජීවිතය නැතිවෙන අයට ඒක සම්බවන්නේය.”** (මතෙව් 16:24-25) කිතුණු ජීවිතයේ එක් වැදගත් කාරණයක් නම් අපගේ මමත්වය ප්‍රතික්ෂේප කර, අපගේම ජීවිත අත්හැරීමෙන් දෙවියන් වහන්සේ අපට දෙන්නා වූ ජීවිතය සොයා ගැනීමයි. යේසුස් වහන්සේ පැමිණියේ අපට ජීවනයේ බහුලත්වය ලබාදීමට වන සේක. (යොහාන් 10:10) නමුත් ජීවනය ඇත්තේ අප තුළ නොව උන්වහන්සේ තුළය.

පෙරමඟ දූතයා මෙම කලාපයේ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ අපවම ප්‍රතික්ෂේප කර අපගේ ජීවිත තුළ ක්‍රිස්තුස් වහන්සේගේ මරණයේ සහ ජීවනයේ බලය වැලඳ ගැනීමයි. මෙහි එක් කාරණයක් නම් සැබෑ ජීවිතය අපට අත්දැකීමට ලැබීමයි. අනෙක් බලවත් කාරණය නම් අපට ස්වාමීන් වහන්සේ සමඟ සහයෝගිතවාය ගැඹුරින් පවත්වාගෙන උන්වහන්සේගේ මහිමය සඳහා ජීවත්වීමයි. **“උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ ජීවත්වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී ඔවුන් වෙනුවට මැරී නැවත නැඟිටුණා වූ තැනැත්තාණන්සේ උදෙසා ජීවත්වෙන පිණිසය කියාත්, අපි නිශ්චය කොට කියමුව.”** (2 කොරින්ති 5:15) අපට ප්‍රේම කරන සහ අප වෙනුවෙන් තමන්වහන්සේගේ ජීවිතය පූජා කළ, ඉක්මනින් අප වෙත නැවත පැමිණෙන ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් අපි අපගේ සියල්ල ලබාදෙමු.

ඔටුන්නට පෙර කුරුසිය

“මඟ යන්නෝ තමුන්ගේ හිස් වන වනා උන්වහන්සේට නින්දා කරමින් දේව මාළිගාව කඩාදමා තුන් දවසකින් ගොඩ නගන්නා වූ නුඹ නුඹම ගලවා ගනින්න. නුඹ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් කුරුසියෙන් බැස පන්නැයි කිවෝය. ඒ ආකාරයෙන්ම නායක පූජකයොත්, ලියන්නන් හා වැඩිමහල්ලන් සමඟ උන්වහන්සේට කවටකම් කොට ඔහු අනුන් ගැලෙව්විය. තමාම ගලවා ගන්ට නුපුළුවන. ඔහු ඊශ්‍රායෙල්වරුන්ගේ රජය ඔහු දැන් කුරුසියෙන් බසීවා. එවිට අපි ඔහු අදහාගන්නෙමුව.” (මතෙව් 27:39-42)

“සෙනඟ ද බල බලා සිටියෝය. මුලාදැනීහු උන්වහන්සේට ගැරහුවිකරමින් මොහු අනුන් ගැලෙව්විය. මොහු දෙවියන් වහන්සේගේ තෝරාගත් ක්‍රිස්තුස් නම් තමාම ගලවා ගනීවයි කීවෝය.” (ලූක් 23:35)

කුරුසිය නැතිව ජයග්‍රහණය ලබා ගැනීමට සාතන් ක්‍රිස්තුස් වහන්සේට යෝජනා කළේය.

අපගේ ස්වාමීන් වහන්සේගේ ජීවිතයේ සහ සේවයේ විවිධ අවස්ථාවලද සාතන් ක්‍රිස්තුස් වහන්සේට උත්තරීතරත්වයට හෝ කුරුසියෙන් තොරව බලයට පහසු මාර්ගයක් ලබා දුන්නේය. නමුත් මෙම දීමනා ලබා දුන් සැමවිටම උන්වහන්සේ ඒවා ප්‍රතික්ෂේප කළ සේක.

යේසුස් වහන්සේගේ සේවයේ ආරම්භයේදී යක්ෂයා මෙම ස්වභාවය පැවසූ විට යේසුස් වහන්සේ මෙම විකල්පයට මුහුණ දුන් සේක. ඔබ බිම වැටී මට නමස්කාර කරන්නේ නම් ලෝකයේ සියලුම රාජ්‍යයන් සහ ඒවායේ තේජස මම ඔබට දෙන්නෙමි. (මතෙව් 4:8-10, ලූක් 4:5-8) මෙය කුරුසිය නැතිව ඔටුන්න ලබා ගැනීමටත්, මරණය නැතිව ජයග්‍රහණය හිමිකර ගැනීමටත් යෝජනා කිරීමයි. ඇත්ත වශයෙන්ම මෙම පෙළඹවීමේ මුළු බලයම රැඳී තිබුණේ දුක්විඳීමෙන් බැහැරව බලයේ අපේක්ෂාව තුළ නින්දාවකින් තොරව උසස්වීමයි.

කුරුසිය නැතිව ජයග්‍රහණය ලබා ගැනීමේ එම යෝජනාවම ග්‍රීක්වරුන්ගේ පැමිණීමේදද යේසුස් වහන්සේට ඉදිරිපත් කරන ලද අතර ඔවුන් එක් ගෝලයෙකුට කතාකොට, **“අපි ... යේසුස් වහන්සේ දකින්නට කැමැත්තෙමු යයි කිවෝය.”** (යොහාන් 12:21) ඇතැම් අය සිතන්නේ ග්‍රීක් ජාතිකයන් උන්වහන්සේට තම රටට පැමිණෙන ලෙස ඉල්ලා සිටි බවත්. එහිදී, උන්වහන්සේට මරණ තර්ජනයෙන් නිදහස්වී ආරක්ෂා සහිතව තම කාර්යය කරගෙන යාමට හැකි බවත්ය. යේසුස් වහන්සේ එම ආරාධනයට මෙසේ පිළිතුරු දුන් සේක. **“සැබැවක්, සැබැවක් නුඹලාට කියමි ගෝධූම බීජය පොළොවෙහි වැටී නොමළොත් තනිව තිබෙයි. නමුත් මළොත් බොහෝ ඵල දෙයි.”** (යොහාන් 12:24) නැතිවී සිටින්නා වූ ලෝකයට තම ජීවිතය දිගු කිරීමට පෙර තම මරණය ලබාදිය යුතු බව ක්‍රිස්තුස් වහන්සේ දැන සිටි අතර එය මඟහැරීම උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක.

තුන්වෙනි අවස්ථාවේදීත් යේසුස් වහන්සේට මෙම අවස්ථාව මුණ ගැසුණේය. යේසුස් වහන්සේ පොලොවේ තම සේවය අවසන්වීමට ආසන්නව යෙරුසලමට යමින් සිටියදී යෙරුසලමේදී තමන් වහන්සේට සිදුව දේ පැවසූ සේක. තමන් වහන්සේව නින්දාවට ලක් කරන බවත් නායක පූජකයන් සහ ලියන්නන් විසින් ප්‍රතික්ෂේප කරනු ලබා කුරුසියේ ඇණ ගසනු ලබන බවත් පැවසූ සේක. ප්‍රේත්‍රුස්ගේ මාංශික මනසට මෙය ඛේදවාකයක් වූ අතර එය ඔහුගේ මුළු සේවයම අවලංගු කිරීමට හේතුවීමට ඉඩ තිබුණි. ඔහු යේසුස් වහන්සේව පැත්තකට රැගෙන

(පාවුල් ඊ බිල්හිමර විසිනි.) (1897-1984)

ගොස් උන්වහන්සේට තරවටු කරමින් මෙසේ පැවසුවේය. **“එවිට ප්‍රේත්‍රුස් උන්වහන්සේ කැඳවා තරවටු කරන්නට පටන් ගෙන ස්වාමීනි ..., එය ඔබ කෙරෙන් දුරුවේවා. ඔබට කිසි කලෙකත් එසේ සිද්ධ නොවන්නේ යයි කීවේය.”** (මතවේ 16:22) නැවතත් යේසුස් වහන්සේ මෙම පරීක්ෂාව ප්‍රතික්ෂේප කරමින් ප්‍රේත්‍රුස්ට පැවසුවේ **“නුමුත් උන්වහන්සේ හැරී පේත්‍රුස්ට කතාකොට, සාතන් මා පස්සට යව, නුඹ මට බාධාවක්ය. එක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා විස දෙවියන් වහන්සේගේ කාරණා කල්පනා කරන්නේ නැතැයි කී සේක.”** (මතෙව් 16:23)

කලින් සිදුවීමේදී යේසුස් වහන්සේ කුරුසිය මත මැරෙන බව අපට විස්තර කර තිබෙන සේක. උන්වහන්සේගේ මරණය පිළිබඳ අනාවැකි ඉටුවෙමින් පවතී. මෙම භයානක මොහොතේ උන්වහන්සේගේ අපේක්ෂාවන් සම්පූර්ණයෙන්ම යුක්ති සහගතවේ. මෙම පදය සඳහා යේසුස් වහන්සේ මේ ලෝකයට ආ සේක. නැවත වාරයක් කුරුසියේ ඇණ ගැසීමේ වේදනාව තුළ සිටියදී මෙම පරීක්ෂාව නැවත මතු විය. **“..... නුඹ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් කුරුසියෙන් බැසපන්නැයි කීවෝය.”** (මතෙව් 27:40) යේසුස් වහන්සේ එය භාවිතා කළ සේක්නම් එසේ කිරීමට බලය ඇති බව පැවසීමට අවශ්‍යය නොවේ. **“දේවදූතයන් ලෙගියොන් දොළසකට වඩා මා ළඟට වේ දැන් එවන ලෙස මාගේ පියාණන්ගෙන් ඉල්ලන්ට මට බැරියයි නුඹ සිතනවාද .. ? එසේ ඉල්ලුවොත් වේ ආකාර වෙන්ට ඕනෑ යයි කියන ලියවිලි සම්පූර්ණ වන්නේ කොහොමදැයි ඔහුට කී සේක.”** (මතෙව් 26:53-54) ගෙත්සෙමන උයනේ දී යේසුස් වහන්සේ ප්‍රේත්‍රුස්ට මෙය පැවසූ සේක. කල්වාරියේ දී තිත්ත කාඩිය රස

5 පිටුවට

4 පිටුවෙන්

ඔටුන්නට පෙර කුරුසිය...

බැලූ අවස්ථාවේදී තමන්වහන්සේව ගළවා ගැනීමටත් කුරුසියෙන් බැස ඒමටත් පෙළඹීම තියුණු විය. උන්වහන්සේගේ හෘද ස්පන්දන වේගය වැඩිව තිබියදී සෑම ස්නායුවකම, මාංශ පේෂියකම වේදනාවේ තියුණු බව සමගින් අත්හැරීමේ හැඟීම උන්වහන්සේව පොඩි කරද්දී, **"නුඹ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් කුරුසියෙන් බැසපන්න...."** යන උපහාසය පැමිණියේ දරුණු බලයකිනි.

උන්වහන්සේ කුරුසියෙන් බැස එයිද...? උන්වහන්සේ තමන් වහන්සේව බේරා ගැනීමේ අභියෝගයට පිළිතුරු දෙයිද ... ? උන්වහන්සේ අවසානයේදී කුරුසිය ප්‍රතික්ෂේප කරයිද .. ? විශ්වයේ සිංහාසනයේ අවදානමට ලක්කර කුරුසියෙන් බැස එයිද ..? උන්වහන්සේට ස්වර්ගීය සිංහාසනය අහිමි වෙයිද .. ? අමුතු දෙයක් ලෙස පෙනුනත් අවසානයේ දී සාතන්ව පරාජය කර සම්පූර්ණයෙන්ම අහෝසි කර ඌගේ අධිකාරීබලයෙන් නෙරපා හැරියේ මෙතනදීය. එෆ්.ජේ. හියුගල් මෙසේ පවසයි. "ලෝකයේ සිංහාසනය කුරුසියකි. ක්‍රිස්තුස් වහන්සේ කුරුස ගසේ සිට රජකම් කරන සේක. උන්වහන්සේ කුරුසියට ගිය නිසා අද ක්‍රිස්තුස් වහන්සේ විශ්වයේ උත්තරීතර වන අතර එළිදරව් පොතේ ප්‍රකාශ කරන පරිදි උන්වහන්සේගේ එම උත්තරීතරභාවය යම් දිනෙක විවෘතව ප්‍රකාශ වනු ඇත. ප්‍රිය මිත්‍රවරුණි, උන්වහන්සේට කුරුසිය හැර වෙනත් මාර්ගයක් නොතිබූ අතර අපට ද වෙනත් මාර්ගයක් නැත. වෙනත් මාර්ගයක් ඇති බව සාතන්ගේ රැවටීමකි.

මෙම සත්‍යතාවය ඓතිහාසික එකක් වූවාට වඩා වැඩි දෙයකි.

ඉහත සියල්ලම සම්පූර්ණයෙන්ම ඓතිහාසිකය. ක්‍රිස්තුස් වහන්සේ අද රජකරන්නේ උන්වහන්සේ කුරුසියට ගොස් මැරී තම ජීවිතය ලෝකයට මුදා හරින තෙක් එහි සිටි බැවිනි. නමුත් එය ඓතිහාසික සත්‍යතාවයට වඩා වැඩි දෙයකි. ඇදහිලිවන්තයන් පිළිබඳව රෝම 6: වන පරිච්ඡේදයේ පාවුල් ලියද්දී එය සදාචාරාත්මක වේ. **"වින් වතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැති වන පිණිස අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසන ලද බව දනිමුව."** (රෝම 6:6) **"එබැවින් ක්‍රිස්තුස් වහන්සේ පියාණන් වහන්සේගේ මහිමය කරුණු කොටගෙන මළවුන්ගෙන් නැඟිටුවනු ලැබුවා සේම අපිත් ජීවයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස බව්හය තුළට බෞතිස්මය කරුණුකොටගෙන උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවෙමුව."** (රෝම 6:4-5) එමෙන්ම පාවුල්තුමා මෙලෙස ද ලියා ඇත. **"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නුමුත් මම ජීවත් වෙමි. නුමුත් නවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වන සේක. නවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ මා උදෙසා තමන්ව පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි."** (ගලාති 2:20)

සියලුම ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට පංගුකාරයන් වන බව මෙම පදවල සහ ශුද්ධ ලියවිල්ලේ අනිත් ස්ථානවලත් ඉතා පැහැදිලිව උගන්වයි. නමුත් හියුගල් පෙන්වා දෙන පරිදි ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ මරණය ආත්මික වර්ධනය සඳහා ප්‍රයෝජනවත්ව තිබේ. දිව්‍යමය දෘෂ්ටිකෝණයෙන් බැලූ විට එය බොහෝ කලක සිට සම්පූර්ණ වූ ඓතිහාසික දෙයක් වුවද, මානව කෝණයෙන් එය අප කෙරෙහි විශ්වාසය තබා ඇති දෙයකි. එය ක්‍රියාත්මක වන්නේ ඇදහිල්ල ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම තුළ පමණි.

සටන ආරම්භ වේ

අප සම්පූර්ණයෙන්ම ශුද්ධවීමටත්, ලෞකික මනසින් පවිත්‍රවීමටත්, ආත්මයෙන් පූර්ණවීමටත් කැප වූ විට ක්‍රිස්තුස් වහන්සේ සමඟ නිත්‍යානුකූල වශයෙන් කුරුසියේ ඇණ ගසා ඇති අපගේ පරණ මනුෂ්‍යයා සැබවින්ම සහ ප්‍රායෝගිකව කුරුසියේ ඇණ ගසනු ලබන බවට අපි එකඟ වෙමු. අපි අදහස් කරන ක්‍රියාව උන්වහන්සේ දකින විට සහ කැමැත්ත සැබවින්ම අව්‍යාජව තිබෙන බව දකින විට උන්වහන්සේ ප්‍රජාව පිළිගන්නා සේක. ඉන්පසු සටන ආරම්භ වේ. අපි න්‍යායාත්මකව කර ඇති දේ එදිනෙදා ජීවිතයේ කිතුණු අත්දැකීම්වල සහ හැසිරීමේ නිමක් නැති ප්‍රබේදයන් තුළ ප්‍රායෝගිකව සිදු කළ යුතුය. අපගේ පරණ මනුෂ්‍යයා සැබවින්ම සහ ප්‍රායෝගිකව කුරුසියේ ඇණ ගසන බවට අපි එකඟ වූ පසු ප්‍රේත්‍රුස් යේසුස් වහන්සේගේ කුරුසපත්වීම ගැන අනුකම්පා කළ ආකාරයටම ස්වභාවධර්මයේ සහ ආත්මික ජීවිතයේ සියලු දේවලට අනුකම්පා කිරීමට පටන්ගන්නා වූ සාතන් විසින් වහාම විශාල හඬක් සහ හැඩීමක් ඇති කරනු ලබයි. ස්වාමීනී...., මෙය ඔබට සිදු නොවනු ඇත කියා යේසුස් වහන්සේට පැවසූ විට ක්‍රියා කලාක් මෙන් අපි පරෙස්සමින් ක්‍රියා නොකරන්නේ නම් අපි අනුකම්පාව පිළිගන්නෙමු. එවිට කුරුසිය අපගේ නඩුවේදී වරදක් බවත්, අපි කුරුසියට යාම සිදු නොවිය යුතු බවත් අපගේ මාංසය මිය යා යුතු නොවන බවටත් සාතන් සමඟ එකඟ වන්නෙමු.

අනුකම්පාව යනු ඉතා සියුම් දෙයක් මෙන්ම එය බොහෝ විට ක්‍රිස්තුස් වහන්සේගේ ගති ලක්ෂණයක් වන අතර එය මාංශයෙන්ද විය හැකිය. යේසුස් වහන්සේ ප්‍රේත්‍රුස්ගේ අනුකම්පාව ප්‍රතික්ෂේප කළේ එය මාංශයෙන් මිස දෙවියන් වහන්සේගෙන් නොවන නිසාය. උන්වහන්සේගේ සිංහාසනය කුරුසිය දරා ගැනීමෙන් පසුව පැමිණෙන බවත්, එයින් අහක්ව නොයායුතු බවත් යේසුස් වහන්සේ දැන සිටි සේක. ඔබගේ ජීවිතයේ මමත්වයේ මරණය සඳහා සම්පූර්ණ කැපවීමකින් යුතුව ඔබ කුරුසියට යාම වැළැක්වීම සඳහා සාතන් සෑමවිටම කළ හැකි සෑම දෙයක්ම කරනු ඇත. ඔබගේ පරණ මනුෂ්‍යයා මරණයට පත්කිරීම සඳහා කුරුසියට ඉඩදීමට මූලිකව යටත්වීම සිදු කළ විට සාතන් යේසුස් වහන්සේව පරීක්ෂා කළ ආකාරයටම ඔබව පහළට ගෙන ඒමට හැකි සෑම දෙයක්ම කරනු ලබන අතර මෙය ඔබට සිදුනොවේවා කියා පැවසීමට ප්‍රේත්‍රුස් මෙන් කෙනෙකු ඔබ සමීපයෙහි සිටිය හැකිය.

පූජාව බැඳතබන්න.

වර්තමාන කාලයට සහ සදාකාලිකත්වය සඳහා පූර්ණ කැපවීමකින් කුරුසියට යාමට ඔබ මුලදී යටහත් වූ පසු ඔබේ කැපවීම අතහැර කුරුසියෙන් බැසීමට ඇති පරීක්ෂාවට එරෙහිවීමට සැබෑ අධිෂ්ඨානය අවශ්‍ය වන්නේය. ගීතාවලිය 118:27 වන පදයේ මෙවැනි යෝජනාවක් කරනු ලබයි. **"ස්වාමීන් වහන්සේ දෙවියන් වහන්සේය. උන්වහන්සේ අපට එළිය දුන් සේක. පූජාසනයේ අංවල පූජාව රැහැනින් බඳිව්."** මෙය විනෝද චාරිකාවක් මෙන් නොවේ. කුරුසියේ ඇණ ගසන ලද ජීවිතය පිළිබඳව අවධාරණය නොමැතිකම නිසා අපගේ ක්‍රිස්තියානි ධර්මයේ ගැඹුර කණගාටුදායක ලෙස අඩුවී ඇත. ක්‍රිස්තුස් වහන්සේ සමඟ මරණයට පංගුකාරවීමේ පවිත්‍රත්වය අවබෝධ කර නොගැනීම නිසා අන්තරා සහිත ලෙස කුරුසියෙන් බැසීමට යොමුවී ඇත.

යම් කෙනෙක් කුරුසියෙන් බැස එන්නේ කෙසේද .. ?

සමහර අය මගෙන් අහනවා කුරුසියෙන් බැස ඒම ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද කියා. මගේ පිළිතුර නම්, මමත්වය බේරා ගැනීමට උත්සාහ දරන ඕනෑම අවස්ථාවක් කුරුසියෙන් බැස ඒමකි. ආත්මික ප්‍රතිපත්තීන් සම්බන්ධව ඕනෑම පහසු මාර්ගයක් තෝරා ගැනීම කුරුසියෙන් බැස ඒමකි. පැහැදිලි ලෙස සහ නිවැරදිව පැවසුවහොත්, නිදහසට කරුණු දැක්වීමට, තමාවම ආරක්ෂා කර ගැනීම තහවුරු කිරීමට හෝ තමාවම ගලවා ගැනීමට දරණ සියලුම උත්සහයන්ගේ ප්‍රතිඵලය කුරුසියෙන් බැය යාමකි. අනුකම්පාව කුරුසියෙන් බැස ඒමට හේතුවේ. අනුකම්පාව යනු ආත්මාරක්ෂාවයි. එයින් අදහස් කරන්නේ ඔබට අසාධාරණයක් සිදුවී ඇති බව සිතන අතර ඔබට ඒ ගැන කිසිවක් කළ නොහැකි නිසා ඔබ ඔබ ගැනම කණගාටුවීමයි. ඔබ ආත්මානුකම්පාවට යටත් වූ විට කුරුසියෙන් බැස එනු ඇත.

අමනාපයට ගොදුරුවීම කුරුසියෙන් බැස යාමකි. අමනාපය ආත්මාරක්ෂාවකි. එයින් අදහස් කරන්නේද ඔබට අසාධාරණයක් සිදුවී ඇති බව හැගෙන අතර ඔබට ඒ ගැන කිසිවක් කළ නොහැකි නිසා කෝපයට පත්වී ඇති බවයි.

තමාගේ නිර්දෝෂීබව ඔප්පු කරන්නට යාම කුරුසියෙන් බැස යාමකි. මක්නිසාද එය කරනු ලබන්නේ ආත්මාරක්ෂාව උදෙසාය. තමා නිර්දෝෂී බව ඔප්පු කිරීමට දරණ වෑයම නිසා ඇති වී තිබෙන ගැටළු මොනවාද .. ? යමෙකුට තමාව නිර්දෝෂී කර ගැනීමට උත්සාහ කිරීමෙන් වැලකී සිටීමට නොහැකි වූ නිසා සභාවන් කැඩී ගොස් ආත්ම විනාශ වී ඇත. ඔබ ඔබවම නිර්දෝෂියි කියා ඔප්පු කිරීමට නම් ඔබ කුරුසියෙන් බැස ආ යුතුය. තමාවම නිදොස් කර ගැනීමට උත්සාහ දැරීම ආත්මආරක්ෂාවකි.

වරද පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සහ එය අන් අය මත පැටවීමට උත්සාහ කිරීම කුරුසියෙන් බැස ඒමකි. යම් දෙයක් උදෙසා තමන්ට වරද පටවා ගැනීම කොපමණ දුෂ්කරද .. ? එමෙන්ම අන් අයට වරද පටවා දොස් පැවරීම කොයිතරම් පහසුද කියා ඔබ දැන සිටින්නේය. එය ආත්මාරක්ෂාවේ ස්වභාවයක් වන අතර එයින් සිදුවන්නේ කුරුසියෙන් බැස යාමකි. යම් කෙනෙක් තමාව වරදවා වටහා ගත්විට තමාව නිදොස් කර ගැනීමට අනවශ්‍ය උත්සාහයක් දැරීම එවැනි දෙයකි. යේසුස් වහන්සේ කළාක් මෙන් අපට කිරීමට නොහැකිව තිබෙන්නේ ඇදහිල්ල නොමැති නිසාය. විශ්වාසවන්ත සාක්ෂිකරුවාණන් ලෙස උන්වහන්සේට අපගේ ආත්ම භාරදෙමු.

තමාව සාධාරණීයකරණය කර ගැනීම යනු කුරුසියෙන් බැස යාමකි. සැබෑ හෝ සිතන්නා වූ සුළු දෙයකදී අමනාපවීම කුරුසියෙන් බැස යාමකි. බොහෝ විට සියල්ලම නොවුනත් අකාරුණික විවේචනය තුලින් ආත්මාරක්ෂාව තමාවම සාධාරණීයකරණය කිරීමේ ස්වභාවයක් වන අතර එයින් කුරුසියෙන් බැස යාම සිදු වෙයි. මගේ අධ්‍යාත්මික කණ්ඩායම සමඟ හෝ මගේ දැකීම සඳහා මුල් බැස ගැනීම හැර අන් කිසිවක් සමඟ සමාගම් නොවී මා සමඟ එකඟ නොවන අයගේ බුද්ධිය හෝ අවංකභාවය පිළිබඳව නිශ්චිත පැහැදලි කිරීමක් ඇති නොකරයි. එය තමාවම සාධාරණීයකරණය කර ගැනීමේ ගති ලක්ෂණයකි.

මම සිතන්නේ අප අතරින් බොහෝ දෙනෙකුට ගැලවීම හා විශුද්ධිකරණය හෝ ආත්මයෙන් පිරී ඇති බවට සාක්ෂි දිය හැකි වුවද අප කුරුසියේ ඇණ ගසන ලද ජීවිතයක් ගතකරන බව පැවසීමට නිර්භීත විය හැකි වන්නේ ඉතා සුළු පිරිසකට පමණක් බවයි.

කුරුසිය ජයග්‍රහණයේ රහසයි

තවමත් ජයග්‍රහණයේ රහස මෙන්න. මූලික වශයෙන් එය අතීත අර්බුදයක් නොවන අතර වර්තමානයේ දිනෙන් දින කුරුසියට යටත්වීමයි. සාතන් කෙරෙහි බලය ප්‍රකාශ කළ හැකි වන්නේ එක් ස්ථානයකදී පමණක් වන අතර ඒ කුරුසියේ රැඳී සිටීමේදීය. යේසුස් වහන්සේ සාතන්ව සම්පූර්ණයෙන්ම පරාජය කරනු ලැබුවේ කුරුසිය මතදී සහ කුරුසිය කරුණුකොටගෙන වූ සේක. කුරුසිය සාතන්ගේ විනාශය විය. සාතන්ට අපට අතගැසීමට නොහැකි එකම ස්ථානය අප කුරුසිය මත රැඳී සිටින විටදීය. ඔබගේ ජීවිතය දෙස ආපසු හැරී බැලුවොත් ඔබ පරාජය වී ඇති එකම අවස්ථාව ඔබ කුරුසියෙන් බැස සිටින විටදීය. තවද ඔබ කුරුසියෙන් බැසීමට පෙළඹුණ සැමවිටදීම ඔබ පරාජයට පත්වී ඇත. කුරුසියෙන් බැසීමට සාතන්ට යේසුස් වහන්සේව පොළඹවා ගැනීමට හැකිවූවා නම්, ඔහු ක්‍රිස්තුස් වහන්සේගෙන් ජයගනු ඇත. අප කුරුසියෙන් බැස එන සෑමවිටදීම සාතන් අපගෙන් ජය ගනියි. සාත්නට අපව කුරුසියෙන් බැසඒමට සැලැස්විය හැකි නම් ඔහු අපව ඔහුගේ බලය යටතේ තබාගන්නවා ඇත. අප කුරුසියේ සිටින විට ඔහුට අප කෙරෙහි බලයක් නැත. නමුත් අප කුරුසියෙන් බැස සිටන තුරු පරාජයට පත්වන අතර ආපසු කුරුසිපත්වන තෙක් නොකඩවා පරාජයට පත්වෙනවා ඇත.

අපි කුරුසියෙන් බැස අපේම දැතින් දේවල් ගෙන අපගේම විනිශ්චය අනුව ගමන් කරන්නේ නම්. ආත්මානුකම්පාව, තමාම සාධාරණීයකරණය කිරීම, අමනාපය හා වෙනත් ආකාරයේ ආත්මාරක්ෂාව සෙවීමට ගොඳුරුවී සිටින විට අපි ඒ සියල්ල අත්හරින තෙක් පරාජය භුක්තිවිඳිනවා ඇත. අප නැවත කුරුසිය වෙතට ගොස් කුරුසියේ සිටීමට ඉගෙන ගන්නා වි අපට නිරන්තරයෙන් ජයග්‍රහණය ලැබෙනු ඇත.

ජෝන් ෆ්ලෙචර් - දෙවියන් වහන්සේ සමඟ ඇවිදගිය මිනිසෙක්

(ඔස්වල්ඩ් ජේ. ස්මිත් විසින් ලියන ලද ෆ්ලෙචර් ඔෆ් මැඩලිගේ නැමති පොතෙන් උපුටා ගන්නා ලදි.)

ජෝන් ෆ්ලෙචර් (1729-1785) නූතන නිකදේමුස් විය. ඔහු සදාචාරාත්මක සහ අවංක චරිතයක් පමණක් නොව ඔහුගේ ස්වභාවයේ සෑම කොටසකින්ම ඔහු ආත්මික විය. 1729 දී ස්විට්සර්ලන්තයේ උපත ලැබූ ඔහුගේ පළමුවන ආගමික හැඟීම වයස අවුරුදු හතේදී පැමිණියේය. අධ්‍යාත්මිකත්වය සඳහා පහසුවෙන් වරදවා වටහාගත හැකි සංස්කෘතියක් සහ ස්වභාවිකව වැඩි දියුණු කළ යුතු පරිසරයක් ඔහුට උරුම වී තිබුණි. කරුණාවේ සුභාරංචිය ගැන නොදන්නා වූ ඔහු බොහෝ දේ කිරීමෙන් සහ දෙවියන් වහන්සේට පිළිගත හැකිවීම උදෙසා ඉතා ආගමිකව ජීවත්වීමෙන් එය බලාපොරොත්තු විය. ජිනීවා හී ඔහුගේ ශිෂ්‍ය අවදියේ දී ඔහු ආගමික විෂයන් ගැන ලියා තිබෙන අතර මිදීමේ ඇදහිල්ල ගැන දැන සිටියත් ආත්මිකව අවිදිවී සැබෑ ලෙස ආත්මික අන්ධභාවයෙන් මිදුණු විට ඔහු කලින් සිටියා වූ තත්ත්වය ගැන පුදුමයට පත්විය.

ජෝන් ෆ්ලෙචර් එංගලන්තයට ගොස් එහිදී මෙතෝදිස්තවරුන් හමුවීමෙන් පසුව ඔහුගේ ජීවිතය පරිවර්තනය විය. ඔහුගේ ජීවිත පරිවර්තනය ගැන ඔහුගේ චරිතාපදානකරු මෙසේ පැවසීය. ඔහුගේ හැරීම මනඃකල්පිත එකක් නොව එය සැබෑ හැරීමකි. එය ඔහුගේ හැඟීම්වලට පමණක් නොව ඔහුගේ හැසිරීම්වලටද බලපෑවේය. ඔහු ගැලවුම්කරුවාණන්ව සොයාගත් අතර උන්වහන්සේගේ මාර්ගෝපදේශකත්වය අනුගමනය කිරීමට තීරණය කළේය. මෙම අධිෂ්ඨානයේ දී ඔහු පසු පස ඇති කිසිවක් ගැන විමසිල්ලක් දැක්වූ බවක් ඒ පැයේ පටන්ම දක්නට තිබුණේ නැත. ඔහුගේ උසස් කාර්යයට සුදුසු ලෙස ගමන් කිරීමට, කරුණාවෙන් වැසීමට සහ සියල්ලේ දී අපගේ ගැලවුම්කරුවාණන්ගේ ධර්මය අලංකාර කිරීමට ක්‍රියා කළේය.

ජෝන් ෆ්ලෙචර් ගැන ඔහුගේ චරිතාපදානයේ කියන විදහට දෙවියන් වහන්සේ සමඟ සමීපව ගමන් කරමින් උන්වහන්සේ ගැන ඉගෙන ගැනීමට, මෙනෙහි කිරීමට, යාච්ඤා කිරීමට තමාව යොමු කළේය. ඇත්ත වශයෙන්ම, ඔහුගේ මුළු ජීවිතයම දැන් යාච්ඤාවේ ජීවිතයක් වූ අතර ඔහුගේ මනස දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි ලෙස යොමු වී ඇත. සමහර විට ඔහු මෙලෙස පැවසීය. දෙවියන් වහන්සේට මගේ හදවත ඔසවන්නේ නැතිව මගේ අසුනෙන් නැගිටින්නේ නැත. උන්වහන්සේ මාව මුණ ගැසීමට පැමිණෙද්දී මම යාච්ඤා කරමින් සිටින්නේ නම් උන්වහන්සේගේ ප්‍රණාමය හිමි වේ. යාච්ඤාවට සහභාගි නොවූ යම් කෙනෙක් මතකයට නැගුනොත් ඔහු වෙනුවෙන් අපි යාච්ඤා කරමු කියා නිතර පවසන්නේය.

ඔහුගේ සේවය මෙම කාලපරිච්ඡේදයේ ඔහුගේ ලිපි සහ දිනපොත තුලින් උපුටා දැක්වීම වඩාත් ප්‍රයෝජනවත් වේ.

තාවකාලික (ලෞකික) දේවලින් මම කරදරයට පත්වීම ගැන මම දෙවියන් වහන්සේට ස්තුතිවන්ත වන්නෙමි. මගේ එකම බිය වන්නේ ජීවිතයට අවශ්‍ය දේ අඩුවෙන් තිබීමට වඩා, ජීවිතයට අවශ්‍ය දේ ඕනෑවට වඩා වැඩියෙන් තිබීමයි. මම දේවල් බහුලව තිබීම නිසා වෙහෙසට පත්ව සිටිමි. මගේ ගැලවුම්කරුවාණන් සමඟ දිළිඳුවීමට මට ප්‍රාර්ථනා කළ හැකිය. අපි පවිත්‍රත්වයේ සාගරය තුළ ගිලී යමු. අපි දිව්‍ය දයාවේගැඹුර දැන ගැනීමට උත්සාහ කරමු. එවැනි උත්සාහයක බැරෑරුම්කම අවබෝධ කර ගනිමු. දෙවියන් වහන්සේ කරුණුකොටගෙන එය අවබෝධ කර ගැනීමට අපගේ ජීවිතය ඊට යොමු කරමු. දෙවියන් වහන්සේ තුළ අතිශයින් සතුටු වෙමු. කණස්සල්ලේ සීමාවේ රැඳී සිටිනවා වෙනුවට ප්‍රීතිය තුළ දැඩි ලෙස පවතිමු. මක්නිසාද අපගේ ක්‍රියාවන්ට උන්වහන්සේව අපගෙන් ඈත් කිරීමට හැකිව තිබෙන බැවිනි. ජීවනය සහ එය වඩා බහුල ලෙස ලබාදෙන්නා වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉදිරියේ මම ඔබට එය නියෝග කරන්නෙමි. ඇදහිල්ලේ සියලු ක්‍රියාවලදී, බලාපොරොත්තුවේ උත්සාහයන්වලදී කවදා හෝ ඔබට දැණුන ප්‍රේමයේ දැල්වීම් මත සිට පසුතැවිලිවීමේ ගැඹුරේ ගිලී ක්‍රිස්තුස් වහන්සේව උසස් කරන ප්‍රීතියේ ඉහළම මට්ටමට නැගී යන ලෙස මම ඔබට අයාචනා කරමි.

මැඩලි හී කළ සේවය

ඔහුගේ පළමු හා එකම දේවගැති සේවය කළේ එංගලන්තයේ මැඩලි හිදීය. සෑම කාලයටම වඩාත් කැපී පෙනෙන ප්‍රතිඵලයක් සහිත පිඹීදීමේ සේවයක් මෙහිදී ආරම්භ විය. මෙම අලංකාර ස්ථානයේ සබත ප්‍රසිද්ධියේම කෙලෙසමින් තිබුණු අතර අතිශුද්ධ දේවල් අවමන් සහගත ලෙස පාගාදමනු ලැබූ, විනීතභාවයෙන් සීමාවන් පවා ප්‍රචණ්ඩ ලෙස බිඳ දමා භාහිර වශයෙන් ද ආගමිකත්වය උපහාසයට ලක් කරන ලදී. එවැනි ස්ථානයකට ධර්මිෂ්ඨකමේ දේශකයෙකු ලෙස ෆ්ලෙචර් මහතාව කැඳවනු ලැබීය. ඔහු වසර විස්සක් තිස්සේ බැබළෙන ආලෝකයක් ලෙස පෙනී සිටියේය. දෙවියන් වහන්සේගේ සත්‍යතාවයට සහ කරුණාවට විරුද්ධ විය හැකි සියල්ලන්ට එරෙහිව ඔහුගේ මුහුණ ගිණි පුපුරක් ලෙස තැබීය. දෙවියන් වහන්සේගේ කරුණාවේ විවිධ අංශවල භාරකරුවෙකු ලෙස ඔහු සෑම මනුෂ්‍යයෙකුටම අවශ්‍යය පරිදි ජීවනයේ වචනය විශ්වාසවන්ත ලෙස බෙදා දුන්නේය. නූගත් අයට උපදෙස් දෙමින්, තර්ක කරමින්, දුරාචාරයේ යෙදුණාවූ අයට අනුශාසනා කරමින්, මුරණ්ඩු අයට තරවටු කරමින්, ඔහු ඉවැන්ජලිස්තවරයෙකුගේ කාර්යය කඩිසරව ඉටු කළ අතර කුඩා කණ්ඩායම් ලෙස එකතු කළ හැකි පොදු නමස්කාර කරන ස්ථානයක හෝ නිවසක හෝ එළිමහනේ හෝ රැස්වෙන අයට ප්‍රීතියෙන් සුභාරංචිය ප්‍රකාශ කළේය.

සුපරීක්ෂාකාරී දේවගැතිවරයෙකු ලෙස ඔහු දිනපතාම තම ජනතාවගේ අවශ්‍යතා සහ ආකල්ප ගැන දැන සිටියේය. වේදනාවෙන් ඔවුන්ගේ පවුල් දෙස බලා පවුලෙන් පවුලට කඩිසරව උගන්වමින් කිසිවෙකුට නූගත් හෝ පහත් ලෙස සලකනු ලැබීමට ඉඩ හැරියේ නැත. ඔහුගේ ආදරණීය අවධානය තම රැලේ පහළම සහ වඩාත්ම නුසුදුසු අය වෙත දක්වමින් සතුටු සිතින් සියල්ලන්ගේ සේවකයෙකු බවට පත්විය. මෙම සේවයේ සමහර අවස්ථාවලදී ඔහු භක්තිවන්තකම වෙනුවෙන් කළ දැඩි ආයාචනා කිරීම් වලින් මුළු පවුල් වශයෙන් තරුණ, මහළු සියලුදෙනා යටහත් වි කඳුළු සලමින් එකවර දෙවියන් වහන්සේ වෙතට හැරී ආවෝය.

ඇත්ත වශයේම සෙනඟගෙන් පිරී තිබුණා වූ ඔහුගේ දේවස්ථානයේ ඔහුට ප්‍රවේශවීමට ඉඩක් නොතිබූ පවුල් කිහිපයක් සිටි අතර එම පවුල්වල සාමාජිකයන් ආලෝකයට වඩා අන්ධකාරයට ආදරය කරමින්, ඔවුන්ගේ ක්‍රියාවන් දෝෂාරෝපණයට ලක්නොවන පිණිස දේවගැතිවරයාට එම පවුල්වලට ඇතුල්වීම ප්‍රතික්ෂේප කිරීමට එකඟවී තිබුණි. සමහර අවස්ථාවලදී පුද්ගලයන්ගේ ගැලවීම ගැන වූ ඔහුගේ ජ්වලිතකම ඒ අය අතරේ ප්‍රකාශ කරමින්, ආයාචනා කරමින් ඔවුන්ට සමීපවීමට නොහැකි විය.

ඔහු අසනීපව සිටි අය සම්බන්ධයෙන් දැක්වූ ආදර්ශවත් බවට සහ නොපසුබට බවට අපි ගරු කරන්නෙමු. ඒ කාර්යයන් සඳහා ඔහු සූදානම්ව සිටි බව වෙස්ලි මහතා පැවසීය. ශීත සෘතුවේදීත්, රාත්‍රියේදීත්, එසේ නැති නම් ඕනෑම අවස්ථාවකදීත් තට්ටුකරන ශබ්දය ඇසුණේ නම් ඔහුගේ දොරටුව මොහොතකින් විවෘත විය. යමෙකුට තුවාල වී හෝ අසල්වැසියෙකු මිය යාමට ඉඩ ඇති බව ඔහු තේරුම්ගත් විට රාත්‍රියේ අඳුර හෝ කාලගුණයේ බරපතලකම ගැන කිසිවිටෙකත් නොසලකා මම වහාම ඔබ වෙතට පැමිණෙන්නම් කියා පිළිතුරු දුන්නේය.

ජෝන් ෆ්ලෙචර් ධර්මිෂ්ඨකම ගැන පමණක් නොව දයාව ගැනද දේශනා කරන්නෙකු විය. එහෙත් ඔහුගේ ජ්වලිතකම ගැන නොසලකා ඔහුගේ ඵල ඉතා සුළු වශයෙන් දැකීමෙන් සහ දෙවියන් වහන්සේගේ මඟනේවීම වරදවා වටහාගෙන උන්වහන්සේගේ කැමැත්තෙන් බැහැර වූ බව සිතමින් කිහිප වතාවක්ම සැකයෙන් ඉවත්ව යාමට පෙළඹුණි. පළමු වසර කුඩා සභාවක් සහ බොහෝ අධෛර්‍යමත්කම් සමඟ ගෙවී යද්දී දෙවන අවුරුද්දේ බොහෝ දෙනෙකුට අතුල්වීමට දේවස්ථානයේ ඉඩ නොමැති නිසා දෙවස්ථානයේ මිදුලේ සිටගෙන දේශනා කරමින් සිටිනවා දුටුවේය.

ආත්මික ලිපි

මේ අවස්ථාවේදී ජෝන් ෆ්ලෙචර්ගේ ලිපි ඔහුගේ හදවතේ ඇති පිඹීදීමේ අත්දැකීම හෙළිකරනු ලැබීය. පහත සඳහන් උපුටා ගැනීම් අධ්‍යයනයට සුදුසුය.

ඔබ ඔබව ප්‍රතික්ෂේප කර ස්වාමීන් වහන්සේව මනුෂ්‍යයන්ගේ හෝ ඔබගේම හදවත මත තැබීමට දෙවියන් වහන්සේ පොළඹවන සෑම කුරුසියක්ම උසුලා ගන්නේ නම් මිස ඔබගේ යාච්ඤාව එතරම් ප්‍රතිඵලදායක නොවනු ඇත. එසේ කරන විට යේසුස් වහන්සේ ආලෝකය බවත්, උන්වහන්සේව අනුග මනය කරන්නා අඳුරේ නොවන බවත් ඔබ වැඩි වැඩියෙන් සොයාගනු ඇත.

සෙමනේරියක් මෙහෙයවනු ලැබීම

හන්ටිංඩන් කවුන්ටස් විසින් තරුණ තරුණියන්ට සේවය උදෙසා අධ්‍යාපනය ලබාදීමට වේල්සයේ සෙමනේරියක් ආරම්භ කළේ මේ කාලයේදීය. සේවයේ කාරණා ප්‍රවේශමෙන් සොයා බැලීමෙන් පසු කවුන්ටස් ප්‍රධාන ගුරුවරයා ලෙස ජෝන් ෆ්ලෙචර්ව තෝරාගත්තේය. ඔහු මෙම නව තනතුර පිළිගත්තේ මෙම නව සේවාව මැඩලි හී ඔහුගේ කාර්යයන්ට බාධාවක් නොවන බව වටාගෙන වූයේය. මෙසේ දෙවියන් වහන්සේගේ කැපවූ දේවසේවකයාගේ දේව සේවයේ නව යුගයක් ආරම්භ වූ අතර ඔහු සෙමනේරියේ තරුණයන් කෙරෙහි ඇති කළ බලපෑම තක්සේරු කළ නොහැකිය. ඔහුගේ චරිතාපදානයේ මෙසේ ලියා ඇත. ඔහුගේ එක් සේවයක් වූයේ උන්වහන්සේ සමඟ සිටීමේ සහ ආශිර්වාදයේ මහිමාන්විත මූලාශ්‍රය වෙත නැඟී එන ලෙස ඔවුන් කැඳවීමයි. එමෙන්ම යාච්ඤා කිරීමට ඔවුන්ව උනන්දු කිරීමයි. අනිත් අය සමඟ සසඳද්දී ඔහුට කිසිවක් සඳහා විවේකයක් තිබුණේ නැත. භාෂාවන්, කලාව, විද්‍යාව, ව්‍යාකරණ , තර්කශාස්ත්‍රය, දිව්‍යමය ස්වභාවය වුවුත් ඔහු පාසල් කාමරය වෙත එන විට පසෙකින් තැබුවේය. ඔහුගේ පූර්ණ වූ හදවත ඔහුට නිහඬව සිටීමට ඉඩ ලබාදුන්නේ නැත. ඔහු කථා

7 පිටුවට

6 පිටුවෙන්

ජෝන් ෆ්ලෙචර්...

කිරීම අවශ්‍යය විය. ශිෂ්‍යයන් වර්ජිල්, සිසෝරෝ, ලතින් හෝ ග්‍රීක ඉතිහාසඥයෙකුට, කවියෙකුට හෝ දාර්ශනිකයෙකුට සවන් දෙනවාට වඩා ක්‍රිස්තුස් වහන්සේගේ මෙම සේවකයාට ඇහුම්කන් දුන්නෝය. ඔවුන් සියල්ලන්ම කඳුළු සලමින් පැවසුවේ බොහෝ කාලයක සිට මෙවැනි දෙයකට ඇහුම්කන් දුන්නේ කලාතුරකින් බවයි. ඔහුගේ ආත්මය තුළ ඇවිලෙන ගින්දරෙන් සියල්ලන්ගේම හදවත් අවිලී ගියෝය.

මෙම අවස්ථාවන් සාමාන්‍යයෙන් අවසන් වන්නේ ගැලවීම ලබන්නා වූ අය අතීතයේ පටන් ඇති සම්භවය ඉගෙන ගැනීමට වඩා ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීම සුභාරංචි සේවයට සුදුසුකමක් හැටියට පෙන්වා දෙමින්ය. ටික වේලාක් පාසල් කාමරයේ සිටිද්දී ඔහු නිතර කීවේ ..., ඔබගෙන් බොහෝ දෙනෙක් මෙම ආත්මයේ පූර්ණත්වය සඳහා පිපාසයෙන් සිටින අතර, මා අනුව මාගේ කාමරයට එන්න කියාය. මේ සම්බන්ධයෙන් අපගෙන් බොහෝ දෙනෙක් ඔහු පසුපස ගිය අතර යාකොබ් මෙන් පොර බඳමින් එකින් එක පිළිබඳව යාච්ඤා කරමින් තවත් දණින් වැටෙන තුරු මෙය වරක්, දෙවරක් නොව බොහෝ වාරයක් සිදුකරන ලදි.

ගිණි උඳුනේ පීඩාවට හසුවීම

ජෝන් ෆ්ලෙචර්ගේ තොල් වලින් පිටවුණු වඩාත්ම ආත්මික පණිවිඩ සමහරක් ඔහුගේ දරුණු රෝගය හා සම්බන්ධ ඒවා වේ. මන්ද ඔහු ක්ෂයරෝග යට ගොදුරු වී සිටියේය. දෙවියන් වහන්සේ තම සේවකයාව පීඩාවේ උඳුන මත තැබීම සුදුසු බව දුටු සේක. එවිට ඔහු උපරිමයෙන් උත්සාහ කරනු ලැබීය. මේ අවස්ථාවේ ඔහුගේ ලිපි වලින් උපුටා ගැනීම වඩාත් උපදේශාත්මකය. මම ජීවිතය ඉතා කෙටි බව දකිමි. කාලය ඉතා වේගයෙන් ගෙවීයයි. ඉතා බැරෑරුම් ලෙස යාච්ඤාවෙන් එම කාලය ගත කිරීමට මම ඉතා සතුටු විය යුතුය. නමුත් මනුෂ්‍යයෙකුට යම් භාහිර කාර්යයක් තිබීම අවශ්‍යය වේ. ප්‍රධාන කාරණය වන්නේ අපි ප්‍රතිඵලදායි ලෙස සේවය කිරීමයි. මගේ උගුර දේව වචනය දේශනා කිරීම සඳහා සකස් වී නැත. මම තුන්, හතර වතාවක් දේශනා කළ විට (එක දිගට) මගේ උගුර ඉදිමෙන්නේය. එබැවින් මගේ කාලය ලිඛිතව මදක් යෙදවීමට මම බැඳී සිටින්නෙමි. එයින් දෙවියන් වහන්සේව මහිමයට පත්කිරීමට මට හැකියාව ලැබේවා .. ! මම ස්වාමීන් වහන්සේගෙන් අයැද සිටියේ උන්වහන්සේගේ අවවාදයෙන් මට මඟපෙන්වන ලෙසත් ඕනෑම තැනකට යාමට හෝ ඕනෑම තැනකට නොයා සිටීමට, ඕනෑම දෙයක් වන්නට හෝ කිසිම දෙයක් නොවන ලෙසත් මා කැමති කරවන ලෙසය... " කියා ඔහු ලියනු ලැබීය.

ඔහු තවදුරටත් මෙසේ ලිවීය..., "අහෝ ..., ජීවිතය ගෙවීයන්නේ කෙසේද ... ? මම ඇවිද ගියෙමි. මම දැන් සදාකාලිකත්වය වෙතට වේගයෙන් දිවයමි. ජීවිතය නැමති පාත්‍රය වේගයෙන් යුතුව කාලය නැමති කන්දෙන් බැස යයි. අපි ප්‍රඥාවන්ත වෙමු. අපි අපගේ පහන් සකස්කර ගනිමු. අපව මිලදීගත් ක්‍රිස්තුස් වහන්සේට නොකඩවා අපව කැප කරමු. සීමාවක් නැතිව එය කිරීමට හැකිවන තෙක් එය ඉටු කරමු. මාගේ ප්‍රියමිත්‍රවරුණි ..., යේසුස් වහන්සේ වෙතින් ඔබව ඇදගන්නා වූ ලෝකයේ ධනයෙන්, වංචාවෙන්, සැලකිල්ලෙන් ප්‍රවේශම් වෙන්න. කාලය පියාඹායන්නේය. වසර ගණන් ඕනෑතරම් තිබීම හෝ හිඟව සිටීම, සාමය හෝ යුද්ධය සදාකාලයට පෙර කඩිනමින් අතුරුදහන්වේ. කාලය පිටපත් සහිතව මැරෙන පැය රැගෙන එන බව අපි දකින්නෙමු. අපගේ බලකොටුව වන ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීමට සහ ආරක්ෂා නගරයේ සිටීමට අපට හැකියාව ලැබේවා. අපගේ අන්තිම සතුරාට විරුද්ධව සම්පූර්ණයෙන්ම ජය ගැනීමට ක්‍රිස්තුස් වහන්සේට හැකිව සිටින සේක. ජයග්‍රහණයේ හිස කරුණුකොටගෙන ජීවමාන සාමාජිකයන්ට සම්පූර්ණ ජයග්‍රහණය හිමිවේ."

ෆ්ලෙචර්ගේ අසනීප කාලය තුළ ඔහුව හමුවීමට ගිය කෙනෙක් මෙලෙස අදහස් දැක්වීය. "මම සොහොනේ එක කකුලක් තබා ඇති මිනිසෙකු බැලීමට ගියෙමි. නමුත් මට හමුවූයේ ස්වර්ගයේ එක පාදයක් තබා ඇති මිනිසෙකි. "

මේ අවස්ථාවේදී ෆ්ලෙචර්ගේ දේවස්ථානයේ සාමාජිකයන්ට ඔහු ලියූ ලිපිය ඔහුගේ චරිතාපදානකරුවන් විසින් වාර්තා කරන ලද වටිනාම ලේඛනවලින් එකකි. එහි කොටස් කිහිපයක් පහතින් සඳහන් කරමි.

"මම සොහොනේ අද්දර වෙවුලමින් සිටින විට එයින් දුරස්ව සිටින ඔබගෙන් සමහරෙකු මා ඉදිරියෙහි එය තුළට වැටිය හැකිය. එවිට අපි සැවොම නින්දෙන් අවදිවෙමු. අප සියල්ලෝම අප වෙත ළඟාවෙන වෙනස සඳහා සූදානම් වෙමු. අපගේ විශිෂ්ඨ වෙනස ප්‍රීතිමත් එකක් වනු ඇතැයි බලාපොරොත්තුවෙන් සුභාරංචිය ලැබෙන තුරු විවේක නොගන්න. හදවත් දැඩිකර නොගන්නා ලෙස මම ඔබගෙන් ඉල්ලමි. දෙවියන් වහන්සේගේ බොහෝ ඉවසිලිවන්තකම අප සියලුදෙනා පසුතැවිලිවීමට යොමු කරත්වා. ඔබගේ පාපය ඉවත දමා ඔබ වෙනුවෙන් ගෙත්සෙමනේදී ලේ හෙළුවා වූ, ඔබ වෙනුවෙන් කුරුසියේ එල්ලී දැන් දෙවියන් වහන්සේගේ මැදිහත්වීම උදෙසා අයැද සිටින යේසුස් ක්‍රිස්තුස් වහන්සේව වැළඳගන්න. පාපිෂ්ඨ ක්‍රියාවන් සහ අවිශ්වාසය කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධව සිටින සතුරන් බවට පත්වේ. පසුතැවිලිවීමේ වස්ත්‍ර ඇතිව දේවභක්තිකයන්ගේ සළුව වන ක්‍රිස්තුස් වහන්සේගෙන් ලැබෙන ශුද්ධකමේ සළුව පැළඳගන්න. ශුද්ධකමේ වස්ත්‍රය නොමැතිව කිසිවෙක් දෙවියන් වහන්සේව දකින්නේ නැත. ඔබගෙන් සමහරෙක් පාපයේ ජීවත් වූ අතීතය අත්හැර දමා පසුතැවිලි වෙමින් පරණ මනුෂ්‍යයා සහ ඔහුගේ ක්‍රියාවන් ඉවත්කර දමන්න. ඇදහිල්ලෙන් ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පැළඳගන්න. සියළු දුෂ්ඨකම් දුරුවී සදහටම පහව ගොස් නව ජීවිතයක් ආරම්භ කරන්න. දෙවියන් වහන්සේට සහ අසල්වැසියාට ආදරය වැඩිකරන්න. "

"ස්වාමීන් වහන්සේ අපගේ සූර්යයා සහ අපගේ ඔටුන්න වන සේක. අපි එකිනෙකාගේ ඔටුන්නෙහි මැණික් වන්නෙමු. එය මොනතරම් මහිමාන්විතද ... ? මම ඔබවහන්සේ තුළත්. ඔබවහන්සේ මාතුළත් සිටින සේක. සදාකාලයටම අපි ස්වාමීන් වහන්සේ සමඟ සහ එකිනෙකා සමඟ සිටින්නෙමු. අපි සියල්ලෝම ස්වර්ගීය සභාව තුළ ජීවත් වන්නෙමු. අපගේ සියලු දවස් සබත් දිනයක් වනු ඇත. අපගේ සබත් සදාකාලික වේ. ඔබගෙන් සමහර අය සිතන්නේ මම සදාකාලිකත්වය සහ අනිත් අයගේ ආත්ම ගැන වඩා වැඩියෙන් යමක් කර තිබෙන බවයි. නමුත් ඔබගේ අතපසුවීම් කොයිතරම් විශාලද .. ? මම ප්‍රසිද්ධියේ සහ පුද්ගලිකව ඔබගේ ආත්මික අවශ්‍යතා ගැන උනන්දුවෙන් සහ සැලකිල්ලෙන් සිටීම පිළිබඳව දුකට සහ ලැජ්ජාවට පත්නොවෙමි. ස්වාමීන් වහන්සේ මට කරුණා කරන සේක. මගේ සමාදානයට බාධා කිරීමට සතුරාට ඉඩ නොදෙන සේක. බලාපොරොත්තුව තුළ මට මරණයෙන් ජය ලබාදෙන සේක. අපගේ ස්වාමීන් වන යෙසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණුකොටගෙන මේ උතුම් ජයග්‍රහණය අපට ලබා දුන් දෙවියන් වහන්සේට ස්තුති වේවා. දිව්‍යමය කාරණාවලට බාධා කරන්නා වූ සහ ගැලවුම්කරුවාණන් නිදහසේ අපව රැගෙන යාමට බාධා කරන්නා වූ දහසක් පරීක්ෂාවන් විඳ දරා සිටින්නෙමු. "

ස්විට්සර්ලන්තයට සංචාරයක්

බොහෝ යාච්ඤා වලින් සහ උපදෙස් වලින් පසුව ෆ්ලෙචර් තීරණය කළේ ඔහුගේ උපන් රට වෙත පැමිණීම අත්‍යාවශ්‍ය දෙයක් බවත්, ඔහු රෝගාතුරව සිටියත් ඔහුගේ ශාරීරික සුවය මැඩලි ගැනීමේ බලාපොරොත්තුව ඇතිව ස්විට්සර්ලන්තයට ගමන් කළ යුතු බවත්ය. ඔහු නොමැති අතරතුර මැ ලි හී ඔහුගේ සභාවේ සාමාජිකයන්ට ඔහු විසින් ලියන ලද ලිපියෙන් පහත උපුටා දැක්වීම් විශේෂ අවධානයට ලක් විය යුතුය.

"සෑම දවසකම ඔබ ගැන අඩුවෙන් සිතීමට, ක්‍රිස්තුස් වහන්සේ ගැන උසස් ලෙස සිතීමට, අනිත් අය ගැන කරුණාවන්තව සිතීමට ඔබගේ සහෝදරයන් ගැන උසස්ව සිතීමට සහ ඔබ වටා සිටින අය ගැන බලාපොරොත්තු සහිතව සිතීමට යොමුවෙන්න. ඔබ කොතැනක සිටියත් දැල්වෙමින් ආලෝකය බබළවන්න. පාපයේ ඉපැනැලි මත දිව්‍යමය ගින්දර අවුලුවන්න. සත්‍යය වෙනුවෙන් නිර්භීත වෙන්න. ප්‍රේම කිරීමට ශූරයන් වෙන්න. පාපයට විරුද්ධව ගිගුරුම් දෙන පුත්‍රයන් වෙන්න. නිහතමානී පව්කාරයන් කෙරෙහි සැනසිල්ලේ පුත්‍රයන් වෙන්න. ඔබේ ස්වර්ගීක මනස සහ ඔබගේ සහෝදර කරුණාව සියලු මනුෂ්‍යයන්ට දැනගන්ට ලැබේවා. එවිට ඔබ දකින සියල්ලන් පුදුම වී මේ මනුෂ්‍යයන් එකිනෙකාට ප්‍රේම කරන්නේ කෙසේදැයි බලන්න යනුවෙන් පවසනු ඇත. ඔබට ඉවසීම මෙන්ම ඇදහිල්ල සහ බලය අවශ්‍ය වේ. ඔබ දුක්විඳීමට මෙන්ම දෙවියන් වහන්සේගේ කැමැත්ත කිරීමට ඉගෙනගත යුතුයි. එම නිසා ගිනිමය පරීක්ෂාවන් අමුතු දෙයක් ලෙස නොසිතන්න. ඔබගේ ඇදහිල්ල ඔප්පු කිරීමට, ශක්තිමත් කිරීමට ඒවා විශිෂ්ඨ වේ.

ෆ්ලෙචර්ගේ අවසන් අවුරුදු

ඔහුගේ සේවයේ ප්‍රධාන කොටසේදී ෆ්ලෙචර් තනිවම වැඩ කළේය. වසර ගණනාවකට පෙර ඔහුට ක්‍රිස්තියානි කාන්තාවක් මුණගැසුණු අතර ඇය බොහෝ සෙයින් ආකර්ෂණීය වූ මේරි බොසන්කුයිට්ය. නමුත් ඇගේ ධනය නිසා ඔහු ඇයව දිනා ගැනීමට උත්සාහ කළේ නැත. ඒ හා සමානවම ඇයත් වසර ගණනාවක් පුරාවට ඔහුව නිතරම මතකයේ තබාගෙන සිටි අතර එය බොහෝ දෙනෙකුට ආශ්චර්යාදයක් බව ඔප්පු කළ කාර්යයක් ඉටු කළාය. ස්වාමීන් වහන්සේගේ සෙනඟ සමඟ ඇති බැඳීම නිසා ඇයව ඇගේම නිවසින් පිටුවහල් කරන ලද දවස පැමිණ ඇය සතු සියල්ල ඇගෙන් ඉවත්කර දමන ලදී. ඔවුන් දෙදෙනාව ඇත්කර තිබූ ධනය නැමති බාධකය ඉවත්වීමත් සමඟ 1781 නොවැම්බර් මාසයේ දී ඔවුන් දෙදෙනා විවාහ විය.

ඉන් වසර හතරකට පසු 1785 අගෝස්තු මාසයේ දී ෆ්ලෙචර් මහතා දවසේ බොහෝ වේලාවක් වැඩකර නිවසට පැමිණියේ මට ශීතලයි යනුවෙන් පවසමිනි. සිකුරාදා සහ සෙනසුරාදා ඔහුගේ තත්ත්වය නරක අතට හැරුණු අතර බොහෝ යාච්ඤා කිරීමට යොමු විය. උෂ්ණත්වය ඉහළ යමින් තිබියදීත් ඉරිදා සුපුරුදු පරිදි දේශනා කිරීමට අවශ්‍ය බව ඔහු අවධාරණය කළේය. ඔහුට නැගී සිටීමට දුෂ්කර වූ අතර සෑම දෙනාගේම දෑස් ඔහු වෙත යොමුවිය. නමුත් ඔහු දේශනා කිරීමට පටන්ගත් විට ඔහු ශක්තිමත් විය. අතීතයේ දී තිබූ නිදහස සහ ශක්තිය ඔහු වෙත නැවත පැමිණියේය. ඔහුගේ වටපිටාවට ඉහළින් ඔහුව ඔසවා තැබූ අතර ඔහුගේ දේශනාවට සභාව සෙළවුණාය. පසුව ඔහු ස්වාමීන් වහන්සේගේ මේසයේ මුලසුන දැරූ අතර ඔහුගේ ශාරීරික දුර්වලකම නැවත පැමිණියේය. ඔහු තමාගේ දුර්වල (මරණයට පත්වෙමින් තිබුණ) දැතින් තම ස්වාමීන් වහන්සේගේ ප්‍රේමයේ සංඛේතය බෙදා දුන්නේය. අවසානයේ දී ඔහු ක්ලාන්ත වූ අතර ඔහුව ඔහුගේ නිවසට රැගෙන ගියේය.

ඊළඟ සතියේදී ෆ්ලෙචර් ඔහුගේ බිරිඳ සමඟ කථා කළේ දෙවියන් වහන්සේ ප්‍රේමයයි ...., ප්‍රේමයයි...., ප්‍රේමයයි ..., කියාය. උන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳ එවැනි ප්‍රකාශනයක් ඔහුට ලබා දුන් අතර ෆ්ලෙචර් ඔහුගේ මිදුම්කරුවාගේ ප්‍රශංසාව ශබ්ද නගා කෑගැසුවාය. සෙනසුරාදා සවස වන විට ඔහුගේ ශක්තිය සහ හුස්ම දුර්වල විය. එතැන් සිට ඔහු ස්වාමීන් වහන්සේ තුළ සමාදානයේ සැතමෙන් විවේක ගනු ලැබුවාය. 1785 අගෝස්තු මස 14 වෙනි ඉරිදා ඔහුගේ ආත්මය ඔහුගේ ස්වාමීන් වහන්සේගේ සදාකාල ප්‍රීතියට ඇතුල් විය. එවිට ඔහුගේ වයස අවුරුදු පනස් පහකි.

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

ඔබගේ පුද්ගලික පිඹීදීම

(ජේම්ස් ඒ ස්ටුවර්ට් විසිනි.) (1910-1975)

මගේ ජීවිතයේ බර නම් ස්වාමීන් වහන්සේගේ කාර්යය සඳහා උන්වහන්සේගේ පිඹීදීම නැවත ලබා ගැනීමයි. මේ හේතුව නිසා දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ බොහෝ දෙනෙක් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ 100% ක්ම ජීවත්වීම වෙනුවට අඩ සිතකින් පමණක් ජීවත්වමට උත්සහ දරති. මම ලෝක ව්‍යාප්ත පිඹීදීමක් උදෙසා ආශාවෙන් හා යාච්ඤාවෙන් සිටින්නේ පිඹීදීමේ දවස් ගෙවීගොස් අවසන් නැති බව විශ්වාස කරන නිසාය. ආශිර්වාදලත් ශුද්ධාත්මයාණන් වහන්සේ පොළොවේ වැඩ සිටින තෙක්, උන්වහන්සේගේ මහා ස්ථීර වූ ආශ්චර්යයන් වන තෙක්, සභාවේ තත්ත්වය අපේස්තුළුවරුන්ගේ දවස්වලදී තිබූ ආකාරය මෙන්ම පවතින්නේය.

දෙවියන් වහන්සේගේ සෑම සභාවක් වෙතම උන්වහන්සේගේ ආත්මයේ බලවත් උදම් රැල්ලක් යැවීමට අවශ්‍යය බව මම විශ්වාස කරමි. මෙය අපගේ සේවයේ නැවත නැවත සිදුවීමේ ප්‍රතිඵලය ලෙස දහස් ගණන් දෙනා ගැලවීම ලබා ඇති බව දැක ඇත්තෙමු. මාගේ සහෝදරයා, සහෝදරිය මේ දිනය ඔබ වෙත පිඹීදීමක් එවීමට දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන බව විශ්වාස කිරීමට මට හේතු තිබේ. මෙය උන්වහන්සේගේ මුදාගත් අයගේ ජීවිත සඳහා උන්වහන්සේගේ සැලසුම් සහ අරමුණු සමඟ සම්බන්ධව තිබේ. දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ගේ මනමාලිය සඳහා උන්වහන්සේ නියම කර ඇති ප්‍රමිතියට වඩා අඩුවෙන් ජීවත්වීම කිසිම යුගයකදී සැහීමට පත්නොවන සේක. තම මනාලිය පහත් මට්ටමේ සිටීම කිසිම පුරුෂයෙකු සැහීමට පත් නොවේ. අපගේ පියාණන් වහන්සේට තම සභාව ශුද්ධ වූ සහ බලසම්පන්නභාවය වඩා අඩු දෙයක් දැකීමෙන් එක මොහොතකටවත් සැහීමකට පත් විය නොහැකි අතර උන්වහන්සේ අරමුණු කර ඇති පරිදි උන්වහන්සේ සමඟ අත්‍යාවශ්‍ය සහයෝගීතාවයකින් ජීවත්වීම අවශ්‍ය වේ. සාමාන්‍ය නොවන සහ පසුගාමී සභාවක් යනු ශුද්ධ, බලවත්, සර්වබලධාරී දෙවියන් වහන්සේට අපහාසයක් සහ නින්දාවකි.

අපි සැම දෙනාටම පුද්ගලික පිඹීදීමක් අවශ්‍යව තිබේ.

දෙවියන් වහන්සේගේ සෑම දරුවෙකුටම අවශ්‍ය වන්නේ පුද්ගලික පිඹීදීමකි. බ්‍රිතාන්‍යයේ පැරණි මෙතෝදිස්ත ශුද්ධවන්තයෙක් තමන් වටා හුණු සලකුණක් ඇඳගෙන ස්වාමීනී, මේ කවයේ සිටින සියලුදෙනාට පිඹීදීම දෙන්න කියා කීවේය. එය සිදුවෙමින් පැවතුණි. එවැනි දේවල් පුද්ගලිකව සහ ප්‍රායෝගිකව කිරීමට ඔබ සූදානම් ද ... ? ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට ගැඹුරු ලෙස පූර්ණකර පාවිච්චි කිරීමට බාධාකරන්නේ කුමක්දැයි බැලීමට ඔබ නිරාහාරව සිට යාච්ඤා කිරීමට ඔබ සූදානම් ද ..?

මුඩි මහතා එය මෙලෙස පැහැදිලිව ප්‍රකාශ කළේය. දේවස්ථානවල කැප නොකළ ධනය, භාවිතයට නොගත් හෝ වැරදියට භාවිතා කළ බලය පවතින්නේය. සියොන්හී සැහැල්ලුවෙන් වැඩ කරන විශාල පිරිසක්, ස්වාමීන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි නොදෙන සාක්ෂිකරුවන් සහ ආත්මයේ අනුග්‍රහය නොමැතිව වැඩ කරන අය සිටිති. ඈත සිට අනුග මනය කරන ගෝලයින්, ජීවයෙන් තොර ආකෘතීන් අභ්‍යන්තර ජීවය සහ බලය වෙනුවට දේවස්ථානවල යන්ත්‍රෝපකරණ පවතින්නේය. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තුස් වහන්සේ තුළ බොහෝ ඇදහිලිවන්තයන් අපට අහිමිවී ඇත. ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණව සේවය කිරීම තුලින් උන්වහන්සේට ඔවුන්ව පූර්ණ කිරීමට හැකි වන සේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ අසීමිත සම්පත් සහ අතිවිශාල (මැනිය නොහැකි) බලය පාවිච්චි කර ප්‍රයෝජනයක් නැති සහ පාවිච්චි නොකරන ජීවිත පිළිබඳව අවබෝධ කර ගැනීම කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේගේ පාලනයේ අභිමුඛත්වය සහ පූර්ණත්වය ලබා ගැනීමට හැකි වන්නේය.

අප කෙරෙහි ඇති දෙවියන් වහන්සේගේ බලය එපීස පළමුවන පරිච්ඡේදයේ ප්‍රකාශ කර ඇත්තේ මළවුන්ගෙන් නැගිටුණු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ, පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ සිංහාසනාරූඪ වී සිටින අතර එය දෙවියන් වහන්සේගේ බලය මිස අන් කිසිවක් නොවේ. දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනඟව මිසරයෙන් මුදා ගැනීම සඳහා දෙවියන් වහන්සේගේ බලය සංඛේත වූවාසේම ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම සබාවෙහි ජීවිත හා ක්‍රියාවන් සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ පවතින අති මහත් දිව්‍ය බලයේ ශ්‍රේෂ්ඨත්වය විදහා දක්වනු ලබයි.

ආත්මයෙන් පූර්ණ ජීවිතයක සියලුම ස්වභාවයන් ගැන සිතන්න. (එපීස 1:17-23) නමුත් දස දහස් ගණන් කිතුණුවන් තම ආත්මික කුළුදුල්කම අපිරිසිදු තත්ත්වයකට විකුණා තිබීමේ ඛේදවාචකය දෙස බලන්න.

ඔවුන්ව මුදාගෙන ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාවෙන් ඔවුන්ව නැවත උත්පාදනය කර ඇත. ඔවුන් මහිමය සඳහා බැඳී ඇත. නමුත් කණගාටුදායක දේ නම් බොහෝ දෙනෙකුට දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවලට ආශාවක් නැත. ආත්මෙන් පිරී සිටීමට පිපාසයක් නැත. ඔවුන්ගේ සියළු දේ ස්වාමීන් වන යේසුස් වහන්සේ තුළ හිමිකර ගැනීමට උවමනාවක් නැත. යේසුස් වහන්සේව ගැලවුම්කරුවාණන් ලෙස ජීවිතයට පිළිගන්නා මොහොතේ උන්වහන්සේ සතු සියල්ල ඇදහිලිවන්තයාට අයිති වේ. නමුත් පර්යේෂණාත්මව කෙනෙකුට පුදුමුකාර ත්‍යාගයක් ලබාගත හැකි අතර ආශිර්වාද භුක්තිවිඳිය හැකිවන්නේ ඔහු ඒවා තමන්ටම මුදාගන්නා විට පමණි. දෙවියන් වහන්සේගේ සෙනඟගෙන් බොහෝ දෙනෙක් ප්‍රකාශ කරන්නේ මොනරතම් නොදැනුවත්කමක්ද ... ? ඔවුන් ජීවත්වන්නේ ස්වර්ගයේ සිටින ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ලබා දී ඇති සියලුම ආශිර්වාද වලට වඩා පහත මට්ටමකින්ය. එසේ සිදු වී ඇත්තේ සාතන් විසින් ඔවුන්ගේ ඇස් අන්ධකර ඇති බැවිනි. ඔවුන් ලෞකික වී ඇති අතර කිතුණුවන්ගේ ජීවිතවල ප්‍රීතියක් නැතිව සිටිති. දෙවියන් වහන්සේගේ ගැඹුරු කාරණා තුළට ගමන් කිරීමට ඔවුන්ට ආශාවක් නැත.

අනිත් අතට දාවිත් මෙලෙස යාච්ඤා කළේය. ***"දෙවියන් වහන්ස ...., ඔව්හා දිය දොළුවලට ඉතා ආශාවන්නාක් මෙන් මාගේ ආත්මය ඔබ කෙරෙහි ඉතා ආශා ඇත්තේය. ...."*** (ගීතාවලිය 42:1)

දෙවියන් වහන්සේගේ සෙනඟට විරුද්ධව බරපතල චෝදනාවක් තිබේ. ඒ ඔවුන් දෙවියන් වහන්සේගේ කාරණා ගැන පිපාසයෙන් නොසිටීමයි. ඔවුන් අතරේ සැබෑ දෙවියන් වහන්සේගේ ක්‍රියා කිරීමක් ලබා ගැනීමට ඔවුන් ආශා නොකරන නමුත් ඒ වෙනුවට ඔවුන් ආශා කරන්නේ උද්වේගයටයි. ඔවුන් බොහෝ විට අලසව සිටින අතර උනන්දුවක් නොදක්වයි. නමුත් දෙවියන් වහන්සේ ජීවිතය තුළ ක්‍රියාකරනවා දැකීමටත්, ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීමටත්, ආලේපය ලබා ගැනීමටත්, පිඹීදීමක් අත්දැකීමටත් ඇති එකම මාර්ගය උන්වහන්සේ උදෙසා පිපාසයෙන් සිටීමයි. ***"මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වමින් යමෙකුට පාපිසා ඇත්නම් ඔහු මා ළඟට අවිත් බීවාවේ."*** (යොහාන් 7:37)

ඇදහිලිවන්තයා ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සිටීමටත්, ශුද්ධාත්මයාණන් වහන්සේ ඇදහිලිවන්තයා තුළ සිටීමටත් අතර ලෝකයේ සියලු වෙනස්කම් ඇති බව අපි මතක තබාගත යුතුය. ඇදහිලිවන්තයෙකුට ශුද්ධාත්මයාණන් වහන්සේ නොමැති බව අපට කිසිවිටෙක පැවසිය නොහැකිය. නමුත් දෙවියන් වහන්සේගේ ආත්මය ඇදහිලිවන්තයා තුළ නොතිබීමේ කණගාටුදායක තත්ත්වය පැවතිය හැකිය.

මහත් වූ ගැඹුර සහ උස

අපට තේජසේ දේශයට පැමිණීම (සමීපවීම) කොයිතරම් අසීරුව තිබෙනවාද ...? එය කොයිතරම් වේදනාත්මකද .. ? ආපසු හැරී බලන විට දකින්නට තිබෙන්නේ දෙවියන් වහන්සේ අප තුළ බලාපොරොත්තු වූ දේ ඉටු වී නොමැති බවයි. අපි ගතකරන්නේ යාන්තමින් පවතින්නා වූ කිතුණු ජීවිතයකි. අපි නවැත නැගිට්ටා වූ ක්‍රිස්තුස් වහන්සේ තුළ අතිශයින් ජයග්‍රාහකයන් විය යුතුය. ඇදිහිලිවන්තයාව ක්‍රිස්තුස් වහන්සේ තුළ ආශිර්වාදලත් ස්ථානයට ගෙන ඒමට සහ ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔවුන්ගේ ආශිර්වාදයේ දිව්‍ය බලය හෙළිදරව් කළ හැකි වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණක් වන සේක.

අපගේ හදවත් සහ ජීවිතවල මෙම කාරණා සැබෑ සහ අනර්ඝ බවට පත් කළ හැකිව තිබෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණයි. ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ ලේ වලින් මුදාගෙන මහිමය කරා ගෙන යන ගමනේ සිටියත් බොහෝ දුරට පසුපසින් ගමන් කරමින් අඩක් පමණක් ගොස් සිටීම කණගාටුදායකය. ආත්මිකව ජයග්‍රාහකයෙක් නොවන, ආත්මික කාරණා කෙරෙහි ආශාවක් නැති, දේව වචනයට පිපාසයක් නැති ක්‍රිස්තුස් වහන්සේ තුළ වඩාත් ආශිර්වාදලත් ජීවිතයක් සඳහා පිපාසයක් නැති කෙනෙකුගේ ජීවිතය ආදරණීය මිදුම්කරුවාගේ මහිමාන්විත සුභාරංචියට පරස්පර විරෝධීව තිබේ. ඔහු යේසුස් වහන්සේගේ සුවඳ රැගෙන යන්නේ නැත. මෙම දුක්ඛිත තත්ත්වය සඳහා එක් පිළියමක් වන්නේ ආත්මයෙන් පූර්ණවීමයි. එවිට ජීවිතය බලයෙන් පිරී ඇති බව මිදුම්කරුවාණන්ට පැවසිය හැකිය.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.